මානුෂීය සේවායතන සමූහය

අගෝස්තු 2009

# ක්ෂණික තතු විමසුම - (Rapid Context Assessment )

CONSORTIUM OF CHA HUMANITARIAN AGENCIES (GTE) LIMITED

ISO 9001 REGISTERED

## ජාතික විශ්ලේෂණය


දේශපාලනය 2

පාලනය 2

ආරක්ෂක තත්ත්වය 2

මානව හිමිකම් 3

ආර්ථික සන්දර්භය 4

පරිසරය 5

සිවිල් සමාජය හා මාධ්‍ය අවකාශය 5

මානුෂිය හා සංවර්ධන අවකාශය 5


## දිස්ත්‍රික්ක විශ්ලේෂණ


අම්පාර 6

මඩකලපුව 6

කොළඹ 6

යාපනය 7

මන්නාරම 7

ත්‍රිකුණාමලය 8

වව්නියාව 8


## ප්‍රවනතාවන් විශ්ලේෂණය කිරීම

| | |
|---|---|
| දේශපාලන සංදර්භය | ↗ |
| පාලනය | ↘ |
| ආරක්ෂක තත්ත්වය | → |
| මානව හිමිකම් | ↘ |
| ආර්ථික සන්දර්භය | ↗ |
| පරිසරය | ↘ |
| සිවිල් සමාජය හා මාධ්‍ය අවකාශය | ↗ |
| මානුෂිය හා සංවර්ධන අවකාශය | ↘ |

# සාරාංශය



රජය LTTE සංවිධානය පරාජය කිරීමෙන් පසුව තවදුරටත් දේශපාලනික වශයෙන් ශක්තිමත් වෙමින් සිටි. පසුගිය මාස කිහිපයේදී පැවැත්වූ පළාත්සභා හැතිවරණ 7 ම රජය ජයග්‍රහණය කළ අතර ඔක්තෝබර් මාසයේදී පැවැත්වීමට නියමිත දකුණු පළාත් සභාවද ජයගැනීමේ අපේක්ෂාවෙන් පසුවේ. මේ අතර විරුද්ධ පක්ෂ පුලුල් සංධානයක් සෑදීමේ පරිශ්‍රමයක නිරතවී සිටි. විධායක ජනාධිපති ධුරයේ අනාගතය පිළිබඳව නැවතත් මහජනතාවගේ අවධානයට ලක්වී ඇත. ජනතා විමුක්ති පෙරමුණ පවසන්නේ ව්‍යවස්ථා සංශෝධනයකට තමන් එකඟ වන්නේ මෙම ධුරය අහෝසි කිරීම යන්න එහි සඳහන් වන්නේ නම් පමණක් බවයි. සමහර පක්ෂ සහ සුලු ජන පක්ෂ මේ පිළිබඳව එකඟතාවකට පැමිණ නැත.

අගෝස්තු මාසයේදී රටේ මානව හිමිකම් තත්වයන්හි වැඩි දියුණු වීමක් සිදුවූයේ නැත. මෙම මාසයේදී 24 දෙනෙක් ඝාතනයට ලක්වුණු බවත් 26 දෙනෙත් අත්අඩංගුවට පත්වූ බවත් මාධ්‍ය වාර්ථා කළේය. වරදකරුවන්ට දඬුවම් නොලැබීමල නීතියේ ආධිපත්‍ය ක්‍රියාත්මක නොකිරීම පොලිස් නිලධාරීන් නීතියට පිටුපා ක්‍රියාකිරීම මෙම මාසය පුරාම දක්නට ලැබිණි. අපරාධ වලට සම්බන්ධ පාතාලයේ පුද්ගලයන් ඉවත් කිරීමේ මෙහෙයුමට රජයේ ඉහළ නිලධාරීන්ගේ සහයෝගය හිමිවිණි. නමුත් මෙවැනි ක්‍රියාවලදී සිදුවිය හැකි අපෙක්ෂා කළ නොහැකි ප්‍රතිපලයන් සම්බන්ධුයෙන් සිංහල ජාතික තරුණයන් දෙදෙනකු ගොදුරුවූ අවස්ථා දෙකක්දී අවධානය යොමුවිය. මෙම එක් සිද්ධියකදී එක් තරුණයකුට ජේෂ්ඨ පොලිස් නිලධාරියකුගේ පවුලේ සාමාජිකයින් විසින් පොලිස් නිලධාරීන්ගේ සහය ඇතිව අමානුෂික ලෙස පහර දෙන ලදී. අනෙක් සිදුවීමේ දී අඟුලාන පොලීසියේයැයි කියවෙන නිලධාරීන් පිරිසක් විසින් තරුණයින් දෙදෙනෙකුව ඝාතනය කරන ලදී. මෙම සිද්ධි දෙකේදීම මහජන විරෝධය පැනනැගිණි. මෙවැනි සිද්ධින් සම්බන්ධයෙන් අන්ධයින් ලෙස අතීතයේදී කටයුතු කළ පුද්ගලයින්ද මෙම සිද්ධියෙන් පසුව සැඟවී පවත්නාවූ තර්ජනය පිළිබඳ අවබෝධ කරගෙන නීතිය ක්‍රියාත්මක කිරීමේ වැදගත් කම පසක් කර ගත්හ.

වන්නියේ අවතැන්වූවෝ තවදුරටත් කඳවුරු වලම වාසය කරති. මෑතකදී පතිතවූ වර්ෂාව නිසා ඔවුන්ගේ ජීවන තත්වයන් තවදුරටත් පිරිහී ගියේය. ඒ අතර සමහර කඳවුරු වල සිටි පුද්ගලයින් බිය ගෙන දෙන සුදු වෑන් රථවලින් පැහැර ගෙන ගිය බවටත් ඔවුන් පිළිබඳව කිසිදු තොරතුරක් නොමැති බවත් වාර්ථා වෙමින් පවති.

අඟුලානේ සිංහල තරුණයින් පොලීසියට ගොදුරු වීමේ සිද්ධියෙන් පසුව රාජ්‍ය අංශයේ නොවන සමහර මාධ්‍ය මානව හිමිකම් සහ නීතීයේ ආධිපත්‍ය පිළිබඳව පනවාගෙන තිබූ ස්වයං වාරණයෙන් මිදී කටයුතු කිරීමක් දක්නට ලැබිණි. මේ සමග ව්‍යවස්ථාවේ 17 වන සංශෝධනය බලාත්මක කිරීමේ අවශ්‍යතාව මහජන අවධානයට ලක්විය. එසේ වුවත් ශ්‍රී ලංකාවේ ප්‍රජාත්‍රන්ත්‍රවාදය ස්ථාපිත කිරීමේ කාර්යයේදී කාර්යක්ෂමව නැගී සිටිය යුතු සිවිල් සමාජය මේ අවස්ථාවේ එසේ කිරීමට අපොහොසත් විය.
මානව හිමිකම් සහ පාලනය පිළිබඳව වූ අඳුරු පරිසරය තුල එක්තරා ධනාත්මක පියවරක් ද දක්නට ලැබේ. එනම් යාපනය මහ නගර සභාවට සහ වවුනියාව නගර සභා ඡන්දය පැවැත්වීමට කටයුතු කිරීමයි. මෙහිදී ඡන්දය ප්‍රකාශ කිරීම පහත් මට්ටමක පැවැතියත් මැතිවරණය නිදහස් සහ සාධාරණ අයුරින් පැවැති බව වාර්ථාවේ.
LTTE සංවිධානයේ ස්ව අභිමතය අනුව පත්වූ නව නායක කුමාරන් පත්මනාදන් මලයාසියාවේදී අත්අඩංගුවට පත්වීම රාජපක්ෂ පාලනය ලැබූ මහත් ජයග්‍රහණයකි. ත්‍රස්තවාදී තර්ජනය මුලුමනින්ම පාහේ අහෝසී වී තිබුනත් රජය තම ආරක්ෂක හමුදා වල ශක්තිය තවදුරටත් වැඩිකරමින් සිටි. එමගින් එවැනි තර්ජනයත් නැවත මතු වීමේ ඉඩකඩ අහුරාලයි. රජය ආරක්ෂක වියදම් වැඩිකරන බවටත් අලුතින් හමුදාවට බඳවා ගන්නා බවටත් LTTE පාලනය යටතේ පැවැති ප්‍රදේශ වල ස්ථාවර නව හමුදා කඳවුරු පිහිටුවනු බවටත් ප්‍රකාශ කළේය.
සාර්ව ආර්ථික තත්වයේ දියුණු වීමක් අගෝස්තු මාසයේදී දක්නට ලැබුනු අතර උද්ධමනයද සාධාරණ මට්ටමක පැවැතිණි. ශ්‍රී ලංකාවේ බැඳුම්කර සඳහා වූ ඉහළ අනුපාතිකයකන් කෙරෙහි උනන්දුවෙන් එක්සත් ජනපද ආයෝජන බැංකුවක් ඩොලර්මිලියන 875 ක ආයෝජනය කිරීම නිසා මහ බැංකුවේ විදේශ සංචිත ඉහළ ගියේය. මෙමනිසා අන්තර්ජාතික මුල්‍ය අරමුදල මගින් ආයෝජකයින් තුල ඇති කරන ලද විශ්වාසය තවදුරටත් තහවුරු කළේය.

සාර්ව ආර්ථිකය සම්බන්ධ පුවත් මෙසේ යහපත් වුවත් මහජන ආයතනවල ආර්ථික කළමණා කරනය සම්බන්ධයෙන් මෙවැනි තත්වයකි දක්නට නොලැබේ. මහජන ආයතන පිළිබඳව අධික්ෂණය කරන කෝප් (COPE) ආයතනය නිතුත් කළ වාර්ථා වල දැක්වෙන්නේ තමන් විසින් පරීක්ෂණයට ලක්කරන ලද එවැනි ආයතන බොහොමයන් නිසි ආකාරයෙන් මූල්‍ය කළමණාකරණය ස්දු නොවන බවයි.

අන්තර්මෝසම් වැසි නිසා රත්නපුර සහ කලුතර දිස්ත්‍රික්ක වල ගංවතුර තත්වයක් ඇති විය. මිට සම්පූර්ණයෙන් වෙනස් තත්වයක් දිවයිනේ ගිණිකොණ දිග ප්‍රදේශයෙන් වාර්ථා වන අතර ජනතාව සහ වනෝද්‍යාන වල වෙසෙන සතුන් නියඟයෙන් දැඩි පීඩාවට පත්ව සිටි.

ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ සහ බැහැර කිරීමේ ව්‍යාපෘතින් දෙකක් පිහිටුවීම සම්බන්ධයෙන් මහජනතාවගේ විරෝධය දැක්වීමත් බසනාහිර පළාතේ දොම්පෙ ප්‍රදේශයෙන් සහ දකුණු පලාතේ කිරින්ද ප්‍රදේශයෙන් වාර්ථා විය. මෙමගින් පෙනීයන්නේ මහජනතාවය පිළිගතහැකි දිගුකාලීන විසඳුමක් නාගරික නසළ කළමණාකරනය සම්බන්ධයෙන් සොයාගත යුතුව ඇති බවයි.

## දර්ශකය

| | | | | | |
|---|---|---|---|---|---|
| වෙනසක් නැත | → | මඳ ප්‍රගතියක් පෙන්වයි | ↗ | මඳ පිරිහීමක් පෙන්වයි | ↘ |
| සැලකිය යුතු ප්‍රගතියක් පෙන්වයි | ↑ | සැලකිය යුතු පිරිහීමක් පෙන්වයි | ↓ | | |

# ජාතික විශ්ලේෂණය 27.07.2009– 26.08.2009

## දේශපාලන සංදර්භය

විවාදයට තුඩුදී ඇති විධායක ජනාධිපතිධූරය අහෝසි කිරීම පිළිබඳ කරුණ සම්බන්ධයෙන් විවිධ මතිමතාන්තර පළ වෙමින් පවතී. ජනතා විමුක්ති පෙරමුණ පවසන්නේ විධායක ජනාධිපති ධූරය අහෝසි කරනු ලබන්නේ යන කොන්දෙසිය ඇතුලත් වන්නේ නම් පමණක් තමන් ව්‍යවස්ථා සංශෝධනයකට එකඟ වන බවය. මේ අතර දූසිමක් තරම් වූ දෙමළ සහ මුස්ලිම් පක්ෂ ඔවුන්ට අවශ්‍ය කුමක්ද යන්න පිළිබඳව එකඟතාවයකින් තොරව භේදවී කටයුතු කරති.

මෙම විධායක ජනාධිපතිධූරය අහෝසි කිරීම පිළිබඳව හිටපු ජනාධිපති චන්ද්‍රකා කුමාරණතුංගත් වර්තමාන ජනාධිපති මහින්ද රාජපක්ෂත් විවිධ පොරොන්දු දෙනු ලැබූවත් මෙතෙක් කිසිවක් සිදුවී නොමැත.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහජන පිලේ නායක මංගල සමරවීර මෙවර යම් ප්‍රයෝජනවත් කාර්යයකට එනම් ප්‍රධාන විපක්ෂය වන එග ජාග පය ශක්තිමත් කිරීමට තීරණය කර ඇත.

මේ වතාවේ ඔහු විසින් යෝජිත මංගල්‍යය සිදුවන්නේ එක්සත් ජාතික පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණ අතරය. ඔහු මෙම කාර්යයම ජනාධිපති චන්ද්‍රකා කුමාරණතුංග රජය පැවැති සමයේදී සංධාන රජය සහ ජනතා විමුක්ති පෙරමුණ අතර සිදු කළේය. මෙහි පසුකාලීන වශයෙන් ඇතිවූ අසමගිය එක්සත් ජනතා නිදහස් සංධානය බිහිවීමට මගපෑදුයේය.

ජනාධිපතිවරණය මෙම වසරේ දෙසැම්බර් මාසයේදී පැවැත්වීමට නියමිතව ඇත. මේ සඳහා අපේක්ෂකයින් වන්නේ වර්තමාන ජනාධිපති මහින්ද රාජපක්ෂත් විපක්ෂනායක රනිල් වික්‍රමසිංහත්ය. පසුගිය මැතිවරණයේදී 150000 ක් වූ දෙමල සුලුතර ජන්ද ජනාධිපති මහින්ද රාජපක්ෂ ට පක්ෂව ප්‍රකාශයට පත්විනි.

එක්සත් ජනතා නිදහස් සංධානය සුපුරුදු අන්දමේ ජයග්‍රහණ ලබාගනිමින් සිටි. ඔවුහු සාර්ථක ලෙස සියලුම පළාත් සභා මැතිවරණ (මෙතෙක් පැවැත් වුණු 7) ජයග්‍රහණය කළේය. මිට අමතරව දකුණු පළාත්සභා මැතිවරණය ඔක්තොබර් මස 10 දිනද උතුරු පළාත් සභාව සඳහා මැතිවරණය පැවැත්වීමට ද තිබේ.

මේ අතර පලදායීතාවය අඩු බැවින් මැතිවරණ සඳහා තරඟ වදින පක්ෂ ගණන සීමා කිරීමටද අදහස් පළවෙමින් පවතී. එසේම ආගම් පදනම් කරගෙන ක්‍රියාකාරී වන පක්ෂ තහනම් කිරීමටද මෙමගින් යෝජනා කර ඇති බැවින් මෙය ඉදිරි පියවරක් වශයෙන් සැලකිය හැකිය.

## පාලනය

පසුගිය මාසය පුරාවටම අවධානය යොමුවූයේ නීතියේ ආධිපත්‍ය නිසියාකාරයෙන් ක්‍රියාත්මක නොවීමෙන් ඇතිවූ තත්වයයි. මෙම තත්වය ලංකාවේ දැවෙන ප්‍රශ්නයක් බවට පත්වෙමින් තිබිණ. නමුත් මෙය කැපී පෙනෙන ලෙස නව ආරක් ගත්තේ 2006 දී යුද්ධය ඇරඹීමත් සමගිනි. මේ සමයේදී සියගණනක් පැහැරගැනීම් පැහැගනයාම් ඝාතන සහ අතුරුදහන් වීම් වාර්තා වූ අතර මෙම තත්වය පිළිබඳව පිරික්සීමට ජාත්‍යන්තර සහය සහිත ජනාධිපති කොමිසමක් පත්කිරීමට පවා හේතුවිය.

කෙසේ වෙතත් මේ සම්බන්ධ තත්වයන්ගේ ස්ථාවර වැඩිදියුණුවක් දක්නට නොමැත. රජය ප්‍රකාශ කලේ පවත්නා යුධමය තත්වය හේතුකොට ගෙන වරදකරුවන් අත්අඩංගුවට ගැනීමට හෝ ත්‍රස්තකියා අවසන් කීමට නොහැකි බවයි. මෙම සිද්ධින්වලින් බොහොමයකට ගොදුරුවූයේ ද්‍රවිඩ වැසියන්ය. මෙම අයගෙන් සමහරු බඹඹෑ යට ගොදුරු වූ බවත් එසේත් නොමැති නම් ඔවුන් බඹඹෑ සමග සම්බන්ධකම් පැවැත්වූ අය බවත් බව ප්‍රකාශ විණි. එනිසාම මේ සම්බන්ධයන් ඇතිවන මහජන ප්‍රතිරෝධය අවම විය.

මැයි මාසයේ දී යුද්ධය අවසන් වුවත් බලාපොරොත්තු වූ ආකාරයට ඝාතනයන් අවසන් වූයේ නැත. මෙම අවස්ථාවේදීද අපරාධ කල්ලි වලට සම්බන්ධ පුද්ගලයින් පොලිසිය සමග ගැටුම් ඇති කරගෙන මියයුනු දැකිය හැකිය. මෙසේ මියයනු බොහෝ දෙනා සමාජ විරෝධි ක්‍රියාවල නිරතවූවන් බැවින් මහජන මතය ඊට එරෙහිව පළවීමක් දක්නට නොමැත.

කෙසේ වෙතත් කොළඹට ආසන්න අඟුලාන ප්‍රදේශයේ තරුණයන් දෙදෙනෙකු ඝාතනය කිරීමත් පොලීසියට සම්බන්ධ යැයි කියවෙන පිරිසක් තරුණ ශිෂ්‍යයෙකු පැහැරගෙනයාම හේතු කොටගෙනත් පොලීසිය කෙරෙහි මහජන විරෝධය පළවිය. මෙම අය සිංහල ජාතිකයන් නිසා මොවුන් බඹඹෑ ට සම්බන්ධ යැයි පැවැසීම දුෂ්කර විය.

මෙම අයගේ පසුතලය ඔවුන් අපරාධකරුවන් ලෙස චෝදනා කිරීමට අපහසුකාරී තත්වයක් ඇති කළේය. මෙම අලුත්ම ඝාතනයන් තුලින් වරදකරුවන්ට දඩවම් නොලැබෙන තත්වයන් පෙන්නුම් කෙරුන අතර නීතිය යළි ස්ථාපිත කිරීමේ වැදගත් කම අවධාරණය කරවයි. මෙම ඝාතන පිළිබඳව මහජනතාවගෙන් නැගුණු විරෝධය මාධ්‍යයන්ට තමන්ගේම ස්වයං වාරණය බිඳ දමා බාහිර ලෝකය පිළිබඳවම අවධියෙන් කියාත්මක වීමට උපකාරී විය. පොලිසියට නීතියේ ගරුත්වය සුරුකීමට නොහැකි වීමත් පොලීසිය තුලම නීතිය නැති බවට සාක්ෂි ලැබිමත් ව්‍යවස්ථාවේ 17 වැනි සංශෝධනයට අනුව ඇතිකළ යුතු ස්වාධින පොලිස් කොමිසම හි වැදගත්කම පිළිබඳව සිවිල් සමාජ සංවිධාන හා විපක්ෂයේ ඉල්ලීම තවදුරටත් ශක්තිමත් කිරීමට හේතු විය. නමුත් මෙම සංශෝධනය කීරීමට රජය තවමත් අසමත්වී ඇත.

## ආරක්ෂක තත්ත්වය

මෙය විශේෂ මාසයක් වන්නේ මාවිල් ආරු ජයග්‍රහණයේ තෙවන වසර යෙදීමත් ඍ ඝාතනයන් හි තෙවන සැමරුම යෙදීමත් හා ද්‍රවිඩ දේශපාලන නායකයකු වූ ආචාර්ය නීලන් තිරුචෙල්වම්ගේ 10 වන සැමැරුම යෙදී තිබිමත් නිසාය.

LTTE සංවිධානයේ ජාත්‍යන්තර අංශයේ තමන් විසින්ම පත්කරගත් ප්‍රධානියා වශයෙන් කටයුතු කළ කුමාරන් පද්මනාදන් හෙවත් ණ ජ අගෝස්තු 6 වැනිදා අත්අඩංගුවට ගැනීමට සමත්වීම ශ්‍රී ලංකාවට එරෙහි ව ඉතිරි වී ඇති ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් මැඩලීමේ සුවිශේෂී පියවරක් ලෙස සැලකිය හැකිය. ණ ජ කේ පී අත් අඩංගුවට ගැනීමෙන් අනතුරුව ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ විදේශ රටවල් අමතමින් එම රටවල වෙසෙන බඹඹෑ යට සම්බන්ධ පිරිස් සහ ඔවුන් සතු ඩොලර් මිලියන 300 කට අධික වත්කම් ආපසු ලබාදෙන ලෙසත් ඉල්ලීමක් කළේය.

කේ පී අත්අඩංගුවට ගැනීමට පෙර LTTE යේ නීති උපදේශක විස්වනාදන් රුද්‍රකුමාරන් ඉන්දීය ණිටෙහෙල්කා□ වෙබ් අඩවියට සමග පැවැති සම්මුඛ සාකච්ඡාවකදී පැවැසූයේ තම සාමාජිකයින් නැවත කණ්ඩායම් ගතවීමට කටයුතු කරන බවත් ඊලම් ,අන්තර රජයක්, පිහිටුවීමට උත්සාහ දරන බවත්ය.

බඹඹෑ සමග යුද්ධය අවසාන යැයි කරන ලද ප්‍රකාශය ලඝු කරමින් ආරක්ෂක ලේකම් ප්‍රකාශ කලේ ශ්‍රී ලංකාවේ ආරක්ෂක වියදම් අඩු නොකරන බවත් නවිනතම උපකරණ මිළදී ගැනීමත් බඹඹෑ පාලනය පැවැති ප්‍රදේශ වල යෙදවීම සඳහා අලුතින් යුද යමුදාවට අලුතින් සාමාජිකයින් බඳවා ගත යුතු බවත්ය. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සරත් පොන්සේකා ප්‍රකාශ කලේ උතුරේ ආරක්ෂාව කිසිදු ලෙසකින් අඩු නොකරන බවත් බඹඹෑ පාලනය පැවැති ප්‍රදේශ වල පවතින තාවකාලික කඳවුරු වෙනුවට ස්ථාවර කඳවරු පිහිට විමට සැලසුම් සකස් කරන බවත්ය.

අලුතින් මුදාගත් ප්‍රදේශවල පිරික්සුම් මෙහෙයුම්වල යෙදී සිටින රජයේ හමුදා බඹඹෑ විසින් සඟවා තබන ලද අවි ආයුධ වෙඩි උණ්ඩ පුපුරණ ද්‍රව්‍ය විශාල වශයෙන් සොයා ගනිමින් සිටි.

ශ්‍රී ලංකා ගුවන් හමුදාවද තමන්ගේ තාක්ෂණය ඉහළ දැම්මටත් අලුතින් ගුවන් යානා මිළදී ගැනීමටත් ක්‍රියාකරන බව වාර්තා කලේය මේ අතර නාවික හමුදාවද රටේ ආරක්ෂව වෙනුවෙන් මුහුදේ තම විමර්ශන කටයුතු තර කරන බව වාර්ථා කළේය.

# මානව හිමිකම්

පසුගිය මාසය හා සසඳන විට ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සම්බන්ධයෙන් සඳහන් කළ යුතු මට්ටමේ දියුණුවක් දක්නට නොමැත. මේ සම්බන්ධ තත්වයන් තව තවත් පිරිහී ඇතැයි යමෙකුට පැවැසිය හැකිය. අවතැන්වූවන්ගේ මානව හිමිකම් සම්බන්ධයෙන් සහ අත්අඩංගුවේ පසුවනල පුනරුත්ථාපන කඳවුරු වල සහ රිමාන්ඩ් භාරයේ පසුවන්නන් ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් 17 වන සංශෝධනයෙන් ව්‍යවස්ථවෙන්ම ස්ථාපිත කර ඇති ආයතන වන පොලිස් කොමිසමල ජාතික මානව හිමිකම් කොමිසම ක්‍රියාත්මක නොවන ආකාරයක් ගැනීම සම්බන්ධයෙන් ද වැඩි වශයෙන් කථා බහට ලක්විය.

අඟුලානේ තරුණයන් දෙදෙනගේ ඝාතන සිද්ධීන්ගෙන් පසුව ඇතිවුනු මහජන ප්‍රතිරෝධය ට පසුව ප්‍රකාශයක් කල ජනාධිපතිතුමා මෙවැනි සිදුවීම් තමා කිසිලෙසකින් හෝ නොඉවසන බව ප්‍රකාශ කිරීම ධනාත්මක ලෙස දැකිය හැකිය. මෙම කරුණ සහ උද්ගත වූ තත්වයන් පිළබඳව පිළිබඳව අපි තවදුරටත් විමසා බලමු.

අවතැන්වූවන්ගේ අයිතිවාසිකම්

මෝසම් වැසි වලට මසකට පමණ පෙරාතුව වවුනියාව දිස්ත්‍රික්කයට ඇදවැටුණු මහවැසි නිසා අනාථ කඳවුරු ආශ්‍රිතව ඇතිවූ ගංවතුර තත්වය නිසියාකාර ජලාපවාහන පද්ධතියක අව්‍යශතාව පිළිබඳව බලධාරීන්ගේ ඇස් ඇරවීමට සමත්විය. ගංවතුරෙන් යටවිම නිසා මෙම කඳවුරු භාවිතයට ගැනීමට නුසුදුසු තත්වයට පත්විය. වහල දක්වා පැතිරුණු ගංවතුර සහ උතුරන වැසිකිළි වලවල් වල ඡායාරූප පවත්නා තත්වයන් වචන වලට වඩා හොඳින් විස්තර කළේය. මෙම තත්වය නිසාදෝ නැවැත පදිංචිකිරීමේ සහ පුනරුත්ථාපනය පිළිබඳ ඇමැති නිවේදනයක් නිකුත් කරමින් කිළිනොච්චි සහ මුලතිවු දිස්ත්‍රික්ක වලින් පැමිණි අවතැන් වූවන් හැර අනෙක් සියලුදෙනා ඔවුන්ගේ ම ගම් බිම් වල සති දෙකක් ඇතුලත නැවත පදිංචි කරවන බව පැවසීය.

නමුත් මෙම ප්‍රකාශයට අනතුරුව කෙරුණු නිවේදනයක සඳහන් වූයේ මෙසේ නැවත පදිංචි කිරීම සිදුවන්නේ දිසාපති කාර්යාලයේ ඇති ඔවුන්ගේ ලිපිලේඛන ඇසුරෙන් තහවුරු කරගැනීමෙන් අනතුරුව බවයි එසේ නමුත් මෙම අවතැන් වූවන් අවුරුදු ගණනාවකට පෙර වන්නියට පැමිණි නිසා මෙම අය පිළිබඳ වාර්ථා දිසාපති කාර්යාලයේ ඇතැයිද යන්න සැක සහිතය. එසේ වන්නේ මෙම අය කිළිනොච්චි සහ මුලතිවු දිස්ත්‍රික්ක වලට යාමට පෙර සිටම මුල් පදිංචි ස්ථානයන් අතහැර දමා තිබුණු බැවිණි. මෙම තත්වය මත මොවුන් සති දෙකක් ඇතුලත නැවත පදිංචි කළ හැකිද යන්න පිළිබඳව ගැටළු මතුවේ. බිම්බොම්බ ඉවත් කිරීමට තිබිම සහ අවතැන්වූවන් අතර සිටින බඹඹෑ සැකකරුවන් වෙන්කර ගැනීම යන කරුණු මත ඔවුන් තවදුරටත් රැඳවුම් කඳවුරු වල තබාගනිමින් ඔවුන්ගේ එහා මෙහා යෑමේ අයිතිය සහ ඒ අයගේ නෑදෑයින් හිතමිත්‍රාදීන් වෙත යෑමේ අයිතිය සීමා කිරීම සාධාරණය කළ හැකිද ?

අදාළ කාලසීමාව තුලදී අත්අඩංගුවට ගැනීම් 26 සහ ඝාතනයන් 24 කට වැඩි ගණනක් මාධ්‍යයන් හි වාර්තා වී තිබේ. මෙය නීතිය හා සාමය පවත්වා ගැනීම පිළිබඳව අප කල මුල් ප්‍රකාශය තවදුරටත් තහවුරු කරයි. කෙසේ වෙතත් අපරාධ වලට සම්බන්ධ වූවන් පොලිස් අත්අඩංගුවට ගැනීමේදී පලායාමට තැත්කිරීමේ දී හෝ පොලීසියට පහර දීමට තැත්කිරීමේදී සිදුවූ මරණ සංඛ්‍යාවේ ඉහළ යාමක් දක්නට ලැබේ. මෙවැනි මරණ ගණනාවක් සිදුවීම පොලීසිය මගින් මේ වැනි සිදුවීම් සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශයන් පිළිබඳව සැකයක් මතුකරයි. මෙවැනි ඝාතන අතුරින් අඟුලාන පොලිස් වසමේ සිදුවූ ද්විත්ව ඝාතනයන් පොලීසියේ අමානුෂිකභාවය පිළිබඳව මනාව හෙළිකරයි.

මෙම තරුණයන් ඝාතනය කිරීමේ සිද්ධියෙන් පසුව ඇතිවූ මහජන උද්ඝෝෂණ වල ප්‍රතිඵලයක් ලෙස එම ස්ථානයේ සේවය කළ පොලිස් නිලධාරීන් සියලුම දෙනා හට ස්ථාන මාරුවීම් ලැබුණු අතර මෙම සිද්ධියට වගකිව යුතුයැයි සැක පිට අවම වශයෙන් 6 දෙනෙක් රිමාන්ඩ් භාරයට පත්කරන ලදී.

ජ්‍යේෂ්ඨ පොලිස් නිලධාරියකු ගේ පුත්‍රයෙක් හා සම්බන්ධ සිද්ධියක් මත පොලිස් නිලධාරීන් පිරිසක් පහරදීමකට සම්බන්ධ වීමක් ද වාර්ථා විණි. මෙම සිද්ධිය නිසා කොළඹ අපරාධ විමර්ශන අංශය භාරව සිටි නිලධාරියා එම තනතුරින් මාරුකර යැවීමටත් ඔහුගේ බිරිඳ සහ පොලිස් නිලධාරීන් කිහිප දෙනෙක් රිමාන්ඩ් භාරයේ තැබිමටත් හේතු විණි. මෙම සිදුවීමෙන් අනතුරුව පොලිස්පති ප්‍රකාශයක් කරමින් නීතියට පටහැනිව ක්‍රියාකළ පොළිස් නිලථාරීන් 170 පිළිබඳව පරීක්ෂණ අරඹා ඇති බවත් ජනාධිපති තුමා ගේ උපදෙස් අනුව මොවුන්ට එරෙහිව තදින් ක්‍රියාකිරීමට කටයුතු කරන බවත් පැවසීය. මෙම සිද්ධින් මගින් රටේ නීතිය සහ සාමාහික විනය බිඳවැටි ඇති ආකාරයත් එසේම නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ විනය පිරිහීම කෙතරම් ගැඹුරින් සිදුවී ඇතිදැයි ද හෙළිවේ.

ජූලි 21 සිට අගෝස්තු 20 දක්වා කාල සීමාව තුළ අත්අඩංගුවට ගැනීම්, පැහැරගෙන යාම්, අතුරුදන් වීම් හා ඝාතන පිළිබඳ දත්ත.

:මූලාශ්‍ර ඩේලි මිරර්, අයිලන්ඩ්, වීරකේසරී, තිරුක්කුරල්, සුඩාර් ඔලි, ලංකා පේජ්ල වාලම්පුරි උදයන්*

| | අත්අඩංගුවට ගැනීම් | පැහැරගෙන යාම් | අතුරුදන්වීම් | ඝාතන |
|---|---|---|---|---|
| කොළඹ | 22 | 1 | | 8 |
| කලුතර | 1 | | | |
| ගම්පහ | 2 | | | 2 |
| ගාල්ල | | | | 1 |
| මාතර | | | | 1 |
| මාතලේ | | 1 | | |
| රත්නපුර | | | | 1 |
| අනුරාධපුර | | | | 2 |
| අම්පාර | | 1 | | 3 |
| ත්‍රිකුණාමලය | | | | 2 |
| මඩකලපුව | | 1 | | 1 |
| මන්නාරම | 1 | | | |
| යාපනය | | | 1 | 3 |
| | 26 | 4 | 1 | 24 |

මම මාසයේදී අවම වශයෙන් පැහැර ගැනීම් 4 ත් පිළිබඳව මාධ්‍යය මගින් වාර්තා කර තිබූ අතර එයින් එකක් ආපදා කළමණාකරන සහ මානව හිමිකම් ඇමැතිගේ සම්බන්ධිකරණ ලේකම් වරයකු හා සම්බන්ධව විය. මෙම පැහැර ගැනීම සම්බන්ධයෙන් අදාළ ඇමතිවරයා විසින්ම මිරිහාන පොලීසිය චෝදනා වලට ලක්කරුනු ලැබූයේ ඔවුන් විසින් මෙහිදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග වලින් තොරව මෙම අත්අඩංගුවට ගැනීම සිදු කර ඇති බැවිනි. මෙම අවස්ථාව මගින් තවදුරටත් පැහැදිලි වන්නේ කුමන හෝ තරාතිරමක පුද්ගලයකු අත් අඩංගුවට ගැනීමේ දී ඔහුගේ ලඟම ඥාතියට දැනුම් දීමටත් නියමිත කාලසීමාවේදී උසාවියට ඉදිරිපත් කළයුතු යැයි දැක්වෙන ජනාධිපති උපදෙස් ද නොසලකා පොලීසිය කටයුතු කරන බවයි.

මේ අතර අවතැන් කඳවුරු වල වෙසෙන පුද්ගලයින් අතුරින් සමහරකු පැහැරගෙන යාමට ලක්වීම නිසා වන්නි අවතැන් වූවන් බියෙන් පසුවෙති. මෙසේ රැගෙන ගිය පුද්ගලයින් පිළිබඳව කිසිදු තොරතුරක් නොමැති අතර එක්කෝ ඔවුන් ආරක්ෂක අංශයේ නිලධාරීන් විසින් විටින් විට මෙම අය ප්‍රශ්න කිරීම සඳහා රැගෙන ගොස් ඇතැයි ද එසේත් නැතිනම් අදාළ අය විසින් අල්ලස් ලබාදී මෙම ස්ථාන වලින් පිටවී විදේශ ගතවීමට අවස්ථාව සලසා දී ඇතැයිද සැක කෙරේ.

මිට අමතරව මළ සිරුරු හමුවූ අවස්ථා බියගම සහ ග්‍රෑන්ඩ්පාස් යන ප්‍රදේශ වලින්

සහ තරුණ ගැහැණු ළමුන් දෙදෙනෙකු ගේ සිරුරු කෙළඹ 07 පිහිටි ඇල මාර්ගයක තිබී හමුවිය. මෙම මරණ පිළිබඳව හොඳින් විමර්ශනයට ලක් කෙරුණු බවක් හෝ සැකකරුවන් අත්අඩංගුවට ගත් බවක් වාර්තා නොවිණ. මෙම ගැහැණු ළමුන්ගේ දෙමාපියන් කෙළඹට පැමිණ මෙම මරණ පිළිබඳව අලුතින් පශ්චාත් මරණ පරීක්ෂණ පවත්වන ලෙසත් ඉල්ලා සිටි අතර පොලිසිය විසින් දක්වා ඇති පරිදි මෙය සිය දිවි හානිකරගැනීමක් නොවන බවත් මෙහිදී යම් කරුණු වසන් කිරීමක් සිදුවී ඇති බවත් ඔවුන් විශ්වාස කරති.

පුවත්පත්වල පලවූ මෙම වාර්තා වලින් පමණක් රටේ නීතිය හා සාමය සුරැකීම පිළිබඳව උපකල්පන ඇතිකර ගැනීමට ප්‍රමාණවත් නොවේ. මිට අමතරව සිදුවූ පැහැරගැනීම් අතුරුදහන්වීම් සහ ඝාතන පුවත්පත් වල පළවූයේ නොමැති විය හැකි අතර මිට හේතුව ස්වයං වාරණයද විය හැකිය. පුවත්පත් වාර්ථාකර ඇත්තේ මෙම මස තුල අතුරුදහන් වූවන් පිළිබඳව පමණක් වන අතර මිට අමතරව අවතැන් කඳවුරු වල සිටින්නන් පවසන ආකාරයට විට වඩා විශාල සංඛ්‍යාවක් සුදුවැන් වලින් කඳවුරු වලින් රැගෙන ගොස් ඇත.

ගමන් කිරීමේ නිදහස

Þ 09 මාර්ගය ඔස්සේ බස් ධාවනය ඇරඹීම යාපනය අර්ධද්වීපය් සිට දිවයිනේ අනෙකුත් ප්‍රදේශයන් කරා නිදහසේ ගමන් කිරීමට තිබූ බාධාවන් ඉවත් වීමක් ලෙස එහි වැසියේ සැලකූහ. නමුත් පසුව ප්‍රකාශ වූයේ මෙය අත්හදා බැලීමක් පමණක් බවත් ස්ථාවර ධාවනය ඇරඹී නොමැති බවත්ය. එසේම අර්ධද්වීපයෙන් පිටවීම සඳහා ආරක්ෂක අංශ වෙතින් අවසරපත්‍ර ලබාගැනීම කළයුතු අතර Þ 09 මාර්ගය ඔස්සේ බස් ධාවනය තවමත් සැබෑ නොවූ සිහිනයකි.

කෙසේ වෙතත් භාණ්ඩ ප්‍රවාහනය සඳහා ලොරි රථවලට ආරක්ෂක අංශයේ අවසර ලබාගැනීමෙන් පසුව Þ 9 මාර්ගය භාවිතයට ගත හැකිය. එම නිසා යුද්ධය අවසන්වී ඇතැයි පැවසුවත් තවමත් උතුරේ ජනතාවට නිදහසේ රටේ අනෙකුත් ප්‍රදේශ වලට ගමන් කිරීමේ අයිතිය ලැබී නොමැති බව සඳහන් කළ යුතුවේ.

යුද්ධය පැවැති සමයේ පනවන ලද උතුරු මුහුදේ මසුන් ඇල්ලීමේ තහනම ඉවත් කරන බවට මැතිවරණය පැවැති සමයේ පොරොන්දු දෙනු ලැබූවත් එම තහනම තවමත් ක්‍රියාත්මකව පවතී.

මානව හිමිකම් සම්බන්ධයෙන් වූ මෙම අඳුරු පින්තූරයට අමතරව ධනාත්මක අවස්ථා කිහිපයක්ද මෙම මාසයේදී වාර්ථා විණි. යාපනය සහ වවුනියා නගර සභා සඳහා පැවැති මැතිවරණ සාමාන්‍යයෙන් මෙවැනි අවස්ථවක දක්නට ලැබෙන දරුණු ප්‍රචන්ඩ කාරී සිදුවීම් වලින් තොරව පැවැත්වුණු බව අගයකළ යුතු කරුණකි. මෙහිදී ඡන්දය දුන් ප්‍රතිශතය 20 ක් තරම් වුවත් අදාළ ප්‍රදේශවල ජනතාවට පළාත් පාළන මැතිවරණයකදී ඒ අයලේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය බොහෝ කාලයකට පසුව ලැබීම මෙම මස සිදුවීම් විමසා බැලීමේදී කැපී පෙනෙන එකක් ලෙස සැලකිය හැකිය.

අවතැන් කඳවුරුවල සිටින සිසුන් සඳහා 5 වසර ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටිමට සහ අපොස උසස් පෙළ සඳහා පෙනී සිටිමට අවස්ථාව සැලසීමත් තවත් ධනාත්මක පියවරක් ලෙස සැලකිය හැකිය. අ පො ස උසස් පෙළ සඳහා පෙනී සිටි සිසුන් 1187 න් 170 ළමා සොල්දාදුවන් වශයෙන් සේවය කළ අය වූහ. එසේ ම ළමා සොල්දාදුවන් වශයෙන් සේවය කළ 110 පිරිසක් අඹේපුස්ස පිහිටි පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමද ඔවුන්ගේ දෙමාපියන්ට ඔවුන් හමුවීමේ අවස්ථාවක් ලබාදීමද පැසසිය යුතු කරුණක් වේ.

# ආර්ථික සන්දර්භය

ආර්ථිකය සම්බන්ධයෙන් සලකා බලන විට සාර්ව මූල්‍ය තත්වය ප්‍රධාන වශයෙන් අවධානයට ලක්වූ මාතෘකාව විය. ශ්‍රී ලංකාවේ උද්ධමනය පහත් මට්ටමක පැවැති අතර මෙය මෙම වසරේ ආරම්භයේ සිටම දක්නට ලැබුණු ලක්ෂණයකි. පසුගිය වසරට සාපේක්ෂව මෙම වසරේ පාරිභෝගික මිළ උද්ධමනය අනුපාතිකය අගෝස්තු මාසයේ 0.9% පමණක් විය. මෙමම තත්වය මත මහබැංකුව වාණිජ බැංකු වලට තවදුරටත් පොලිය අඩුකිරීමට ඉඩකඩ සලසන ලද අතර මෙමගින් ණය ලබාදීම් සහ ආයෝජනයන් හි ප්‍රවර්ධනයක් බලාපොරොත්තු විය. මෙම අඩු පොලී අනුපාත අන්තර්ජාතික මූල්‍ය අරමුදල මගින් පැනවූ සමහර කොන්දේසි වලට අනුව කටයුතු කිරීමටත් එමගින් ඉදිරියේදී ලැබීමට නියමිත වාරික ලබාගැනීමටත් ඉවහල්වේ.

මෑත මාසවලදී උද්ධමන අනුපාතිකය සාධාරන අගයක් ගත්තද 2008 වසරේ ඇතිවුණු උද්ධමනයේ පීඩනය තවමත් සම්පූර්ණයෙන් සමනය වී නොමැත. අගෝස්තු මාසයේදී පෞද්ගලික බස්රථ හිමියන් ගාස්තු වැඩිකිරීමක් ඉල්ලා සිටියහ. වතු කම්කරුවන් සහ විදුලිබල මංඩලයේ සේවකයන් වැටුප් වැඩිකිරීමක් ඉල්ලා සිටියහ. මිළ පාලනයට යටත් පාරිභෝගික ද්‍රව්‍ය වෙළඳාමේ නියැලී සිටින සිටින ගෑස් සමාගම් ගාස්තු වැඩි කිරීමේ අවස්ථාවක් ඉල්ලා සිටියහ.

එක්සත් ජනපද බැංකුවක් වන ෆ්‍රැන්ක්ලින් ටෙම්පල්ටන් අරමුදල රජයේ සිව් අවුරුදු සහ සය අවුරුදු බැඳුම්කර වල ඩොලර් මිලියන 875 ක් ආයෝජනය කිරීම මගින් මහබැංකුවේ විදේශ වත්කම් ඉහල නැංවිණි. මෑතකදී ශ්‍රී ලංකාවට ලැබුණු ෂචිත ණය මුදල මගින් ශ්‍රී ලංකාව කෙරෙහි විශ්වාසය වැඩි දියුණු වූ අතර සහ ශ්‍රී ලංකාව පිරිනමනු ලබන ආකර්ශනීය පොලී අනුපාතිකය මෙසේ ආයෝජනය කිරීම සඳහා පෙළඹවීමට තවදුරටත් උපකාරී වන්නට ඇත. දැනට එක්සත් ජනපදයේ අවුරුදු 5 බැඳුම්කර සඳහා ලැබෙන පොලී අනුපාතිනය 3 ට වඩා අඩුය. මිට ප්‍රතිවිරුද්ධ ලෙස ශ්‍රී ලංකාව මගින් ලබා දෙන අනුපාතිකය 13 කට ආසන්න වන අතර අවුරුදු 6 සඳහා වූ අනුපාතිකය 15 තරම් විශාල අගයක් ගනී. මෙම ආයෝජන මගින් රටේ විදේශ වත්කම් ඉහළ යාමට හේතුවනු ඇත. එසේම එමගින් 2008 වසරේ අවසාන කාර්තුවේදී සහ 2009 වසරේ මුල් කාර්තුවේදී විශාල වශයෙන් භාණ්ඩා ගාර බිල්පත් මිළදී ගැනීම මගින් ඇතිවූ විද්ශ විනිමිය පිළිබඳ අර්බුදය යම්තාක් දුරට සමනය කිරීමටද හේතුවනු ඇත. කෙසේ වෙතත් මෙම මුදල් භාණ්ඩාගාරයට දේශිය වශයෙන් වියදම් කිරීමට හෝ සංවර්ධන කාර්යයන් සඳහා යෙදවීමට නොහැකි වනු ඇත. එසේ වන්නේ භාණ්ඩාගාරය මෙම ලබාගත් ණය වලට පොළිය වශයෙන් වසරකට ඩොලර් මිලියන 100 කට ආසන්න මුදලක් මෙම බැඳුම්කර කල්පිරෙන තුරු ගෙවිය යුතුවීමයි.

මහබැංකු අධිපතිතුමා විදේශ සංචිත ප්‍රමාණය බිලියන 5 සිට 6 දක්වා 2011 වසර මුලභාගය වන විට වැඩිකර ගැනීමට ඉලක්ක කරයි. මෙය ශ්‍රී ලංකාව විසින් IMF වෙතින් ජූලි මාසයේදී සුරකුම් ණය ලබාගැනීමේ දී ඔවුන්ට පෙරොන්දුවූ බිලියන 3ග6 ට වඩා කැපීපෙනෙන ලෙස වැඩි අගයකි..

සාර්ව ආර්ථිකය සම්බන්ධයෙන් යම්තාක් දුරට සුබදායී ප්‍රවෘත්ති අසන්නට ලැබුනත් මෙම තත්වය සුලු පරිමාන පෞද්ගලික අංශයේ ආර්ථික කළමණාකරණය සම්බන්ධයෙන් දක්නට නොලැබේ. මහජන ආයතන පිළිබඳව පාර්ලිමේන්තුවේ අධික්ෂණය පිළිබඳව රජය සහ විපක්ෂය අතර විවාදයක් පැවැත්විණි. මහජන ආයතන පිළිබඳව මෙම කම්ටුවේ COPE) සාමාජිකත්වය විපක්ෂයෙන් මෙයට එකතුවූ 16 දෙනාත් සමග 33 දක්වා වැඩිවී ඇත. මෙම කමිටුවේ මූලික කාර්යය වූයේ පාර්ලිමේන්තුවේ මහජන ආයතන 20 ක ගිණුම් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමයි.

කෝප් මගින් අගෝස්තු මාසයේ නිකුත් කල වාර්ථාවකට අනුව මහජන ආයතන බොහොමයක් නිශ්චිත ණය ඉල්ලුම්කරු පිළිබඳව අවශ්‍යතා තක්සේරුවකින් සහ ණය ආපසු ගෙවීමේ හැකියාව සොයා බැලීමෙන් තොරව ණය සැපයීම සිදුකර ඇති බවට චෝදනාවට ලක්කර තිබිණි. එසේම මෙම මහජන ආයතන බොහොමයක් ප්‍රමාණවත් අයුරින් අභ්‍යන්තර මූල්‍ය පාලනයක් පවත්වාගෙන නොමැති බවද පෙනී ගියේය. ඒ වගේම කෝප් සඳහන් කළේ සමහර ආයතන නීතිපති වරයාගේ යම් කරුණු කාරණා සම්බන්ධයෙන් අවශ්‍යයන්ම ගතයුතු නිවැරදි නීතිමය උපදෙස් ලබාගැනීමට අසමත් වී ඇති බවය.

මෙම කමිටුව තවදුරටත් සඳහන් කලේ ශ්‍රී ලංකාවේ බදුගෙවන්නන්න්ද කොටස්කරුවන් ලෙස සිටින විශාලතම ආයතන දෙකක් වන ශ්‍රී ලංකන් ගුවන් සමාගම සහ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය පෞද්ගලික සමාගම් යටතේ ලියාපදිංචි වී ඇති බැවින් තම කමිටුව ඉදිරියට කැඳවීමට නොහැකි බවය.

රජය සංචාරකයින් සඳහා වීසා ගාස්තුවක් අයකිරීමට සූදානම් වේ. මෙය සාධාරණ යැයි පෙනී යයි. දැනට ක්‍රියාත්මක වන පියවර දෙකකින් යුත් ගාස්තු ක්‍රමය එනම් පෞරාණික වැදගත් කමකින් යුක්ත ස්ථාන නැරඹීමට යන අයගෙන් වැඩි මුදලක් සහ අනෙකුත් ස්ථාන වලට යන අයගෙන් තවත් ගාස්තුවන් වශයෙන සිදු කරන ක්‍රමය අහෝසි කර විසා ගාස්තු සමගම අයකෙරෙන පොදු සංස්කෘතින බද්ධක් ලෙස වෙනස් කිරීමේ අවශ්‍යතාවය මත රජය මෙම අවස්ථාව යොදාගනී.

දැනට පවත්නා ද්විත්ව ගාස්තු ක්‍රමය මහත් අපහසුකාරී සහ දූෂණ හා වංචා වලටත් දුර්භාවිතයටත් මගපාදයි. මේ වෙනුවට දේශීය හෝ විදේශීය සංචාරකයින්ට මෙම ස්ථාන වලට ඇතුලු වීමේදී මෙම බද්ධ ගෙවිය හැකිය. මෙම ඒකාබද්ධ විසා ගාස්තු සහ සංස්කෘතික බදු මෙම සංස්කෘතිකමය සහ පෞරාණික ස්ථාන නඩත්තු කිරීම සඳහා සමානව බෙදාහැරිය හැකිය.

# පරිසරය

මිශ්‍ර කාලගුණ තත්වයයක් රටපුරා පැවැතිණි ජූලි මාසය පුරා පැවැති නියගය ඇදවැටුනු වැස්සත් එමගින් ඇතිවූ ගංවතුරත් සමග සමහර ප්‍රදේශ වල නිමාවිය. එහෙත් රටේ තවත් සමහර ප්‍රදේශ වල නියගය එසේම පවතී. අගෝස්තු මස මැද ඇතිවූ වර්ෂාව හේතු කොට ගෙන වයඹ පළාතේ සමහර ප්‍රදේශ වලත් අනුරාධපුරයේත් මැණික්පාම් රුඳවුම් කඳවුර ආසන්න ප්‍රදේශ වලත් දැඩි ගංවතුර තත්වයක් ඇති විය. වාර්ථා වලට අනුව කලාප අංක 2 සහ 4 ප්‍රදේශයේ 100000 කට ආසන්න පිරිසක් මේ නිසා පීඩාවට පත්විය.

වැසිකිලි විශාල සංඛ්‍යාවක් උතුරා යෑම නිසා මළඅපද්‍රව්‍ය ගංවතුර හා මිශ්‍ර වීමෙන් සෞඛ්‍යයට ඉතා අහයහපත් බලපෑමක් එල්ල විය. මෙහි ප්‍රතිපයක් ලෙස උණ සන්නිපාත රෝගීන් කඳවුරු වලින් වාර්තා විය.

දින කිහිපයකට පසු රත්නපුර සහ කලුතර දිස්ත්‍රික්ක ගංවතුර නිසා දැඩිසේ විපතට පත්විය. මෙම නිසා පවුල් 3000 කට ආසන්න පිරිසක් අවතැන් විය. ඉන් අනතුරුව වවුනියාවේ අවතැන් කඳවරු නැවත වතාවක් අන්තර් මෙ-ෝසම් වැසිවලට ගොදුරු විය. මෙම වතාවේ කුඩාරම් 2000 කට වැඩි සංඛ්‍යාවක් භාවිතයට ගත නොහැකි තත්වයට පත්විය. ඊසාන දිග මෝසම ඔක්තෝබර් මාසයේදී පැමිණීමට නියමිත අතර ඊට පෙර මෙම කඳවුරු වල මළ අපවහන පද්ධතිය පිළිබඳව සැළකිළිමත්වීම ඉතා වැදගත්ය. මධ්‍යම කඳුකරයට වැටුණු මහවැසි හේතු කොටගෙන නායයෑම් හතක් වාර්තා වූ අතර මේ නිසා අවම වශයෙන් පුද්ගලයන් දෙදෙනෙකු මරණයට පත්විය.

මේ අතර රටේ ගිණිකොණ දිග ප්‍රදේශය දරුණු නියගයකට මුහුණ දී සිටී. තිස්සමහාරාම සිට බදුල්ල සහ මහියංගනය ප්‍රදේශයේ ජනතාව පානීය ජලය පවා සොයා ගැනීමේ දුෂ්කරතාවයකට පත්වී සිටී. වගාවන් බොහොමයක් ජලය නොමැතිකම නිසා විනාශ වෙමින් පවතී. වැව් සහ පොකුණු සිඳියාම නිසා සතුන් ද බලවත් අපහසුතාවයට පත්වී ඇති අතර මෙම නිසා වනජීවී ආරක්ෂණ දෙපාර්තමේන්තුව යාල සහ බුන්දල පිහිටි ජාතික වනෝද්‍යාන වල පිහිටි වැව් වලට බවුසර මගින් ජලය සපයයි.

කිරිඳිවැල දොම්පෙ ප්‍රදේශයේ ඇරඹීමට නියමිත අපද්‍රව්‍ය බහාලන ව්‍යාපෘතිය පිළිබඳව ගැටලුකාරී තත්වයක් මෙම අගෝස්තු මස මැද භාගයේදී පැනනැගිනි. බලධාරීන් ප්‍රකාශයට පත්කරන ආකාරයට කොරියානු ආධාර යටතේ ඉදිවන මෙම ව්‍යාපාතියේ අරමුණ දොම්පෙ ප්‍රදේශයේ කුණු කසල ප්‍රමාණය හා ඒ හා සම්බන්ධ ගැටලු අවම කිරීමටය. එහෙත් ප්‍රදේශවාසීන් පවසන්නේ මෙම නිසා අගනා සංරක්ෂිත වන සම්පත් එළිපෙහෙලි කිරීමත් විනාශ වීමත් සිදුවන බවත් මෙහි සැබෑ අරමුණ එම දැව සම්පත් ලබාගැනීම බවත්ය. මීට සමාන විරෝධතාවක් ලඟදී කිරින්ද ප්‍රදේශයෙන් ද වාර්තා වූ අතර එහිදී ප්‍රදේශ වාසීන් විරෝධතා දැක්වූයේ අදාළ කසළ ප්‍රතිචක්‍රිකරණ ව්‍යාපාතිය ක්‍රියාවට නැංවුවහොත් ජලය දූෂණය වන බවත් පරිසරහානි ඇතිවන බවත්ය.

ජූලි මාසයේදී ඩෙංගු රෝගීන් වාර්තා වීම අඩුවුවත් අන්තර් මෝසම් වැසි ඇරඹීමත් සමගම රෝග කාරක මදුරුවන් වැඩි වශයෙන් බෝවීම හේතු කරගෙන රෝගයේ වර්ධනය විමක් ඇතිවෙමින් පවතී. දැනටමත් පුද්ගලයින් 240 ක් මෙම රෝගය නිසා මරණයට පත්වී ඇති අතර පුද්ගලයින් 24000 කට රෝගය වැළඳීනි.

# සිවිල් සමාජය හා මාධ්‍ය අවකාශය

අගෝස්තු මාසයේ දී පොලීසිය විසින් සිදුකරන ලද ක්‍රියාවන් සම්බන්ධව මාධ්‍යයට ඔවුන්ගේ සාධාරණ කෝපය පළ කිරීමේ අවස්ථා දෙකක් උදාවිය. මෙයින් එක් අවස්ථාවක සිසුවෙකු පැහැරගෙන ගොස් අමානුෂික ලෙස පහර දෙන ලද අතර අනෙක් අවස්ථාවේදී පොලිස් අත්අඩංගුවේ සිටි තරුණයින් දෙ-දෙනෙත් මිය ගියේය.

මේ සිද්ධින් පිළිබඳව වූ නිරායාසයෙන්ම ඇතිවූ මහජන විරෝධය සහ ඊට එරෙහිව නැගුනු විරෝධතා පුවත්පත් වල සිරස්තල වූ අතර කතුවැකි කිහිපයක් මගින් සිද්ධිය හෙළාදැකීම සහ නිද්‍රාවට වැටි තිබුනු 07 වැනි ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව කතිකාවට පනපොවා තිබිණි.

මෙම සිද්ධීන් දෙකේදී ඇතිවූ මහජන විරෝධය හා අවධානය මත මාධ්‍ය තමන් විසින්ම සාදාගත් සීමිත අවකාශයෙන් හා රාමුවෙන් එළියට පැමිණ කටුයතු කිරීම මාධ්‍ය වලට සහජයෙන් උරුම සහ එමගින් න්‍යායාත්මක වශයෙන් කළයුතු කාර්ය භාරය ඉටුකළ අවස්ථාවක් ලෙස ගත හැකිය.

මෙම නිරීක්ෂණය මාධ්‍යය අවමානයට පත් කිරීමක් නොවේ. මෙහිදී මාධ්‍ය සහ සජීවී සිවිල් සමාජයේ සම්බන්ධතාවය පැහැදිලි වේ. අඟුලාන පොලීසිය වටා එක්රොක්වුනු දහස් සංඛ්‍යාත පිරිස නියෝජනය කළේ කුපිත වූ සහ ක්‍රියාකාරී වූ සිවිල් සමාජයයි. එහිදී නැගුනු සාමුහික හඬ සිද්ධිය පිළිබඳව මාධ්‍ය මගින් පුලුල් ප්‍රචාරණයකට මග පෑදූ අතර එහි ප්‍රතිපලයක් ලෙස ධනාත්මකව ජනතාවාදී ආකාරයෙන් මේ සම්බන්ධව ක්‍රියාකිරීමට බලධාරීන් ව යොමු කරන ලදී .

මේ රටේ තොරතුරු ලබා ගැනීම් නිදහස නොමැත. රජයට තොරතුරු ගලායාම පාලනය කිරීමට හැකිවී තිබෙන අතර එයට මාධ්‍යයේ ප්‍රතිචාරය වූයේ ස්වයං වාරණයක් පනවා ගැනීමත් එහි ප්‍රතිපලයක් ලෙස කිසිම පාර්ශවයකට අවශ්‍ය නොවූ පරිදි පාලනයක් ඇතිවීමත්ය.

මේ පිළිබඳව දොස් නැගියයුත්තේ කාහටදැයි තොරතුරු වල වලංගුභාවය සහ තොරතුරු මූලාශ්‍රයේ වලංගුභාවය පිරික්සීම පිළිබඳ වාතාවරණයක් ඇතිකිරීම සිවිල් සමාජයේ කාර්යභාරයක්ද කටකතා සහ ඕපාදූප අප සමාජයේ ප්‍රභූන් අතර පවා සාමාන්‍ය දෙයක් බවට පත්වී ඇත. මෙය අප සම්පූර්ණයෙන්ම දේශපාලනයෙන් මෝහනයවී සිටිම මගින් තවදුරටත් ව්‍යාකූල තත්වයට පත්කරවයි.
හැඟීම් වලට වඩා තර්කානුකුලව කටයුතු කිරීම් සිදුවේ නම් එය අගයකළ යුතු තත්වයකි. එහෙත් අඟුලානේ දී සිදුවූයේ මීට ප්‍රතිවිරුද්ධ තත්වයයි. සාමුහික වටිනාකම් සඳහා හඬනැගිය හැකි ක්‍රියාකාරී සිවිල් සමා-ජයක් අද අප සමාජයේ දැවෙන අවශ්‍යතාවයක් බවට පත්වී තිබේ. මෙම සිද්ධින් මගින් අප අද පත්වී සිටින බැරෑරම් තත්වය පැහැදිලි කරයි.

අද සමාජය පසුගාමී මෙන්ම අක්‍රියාකාරීද iවේ. සිවිල් සමාජය සමන්විත වන්නේද මෙම සාමාන්‍ය ජනතාවගෙන් ම වන අතර ඔවුන් ට තමන්ගේ අභිලාෂයන්ල කැමැත්ත ක්‍රියාවට නැංවීම් ක්‍රමවේදයන් ඇත. මෙම සිවිල් සමාජය ක්‍රියාකාරී වීමට මිනිසා විසින් හෝ ස්වභාවයන් යම් විනාශකාරී සිදුවීමක් විය යුතුමද ?

# මානුෂික හා සංවර්ධන අවකාශය

*මැණික්පාම් හි ගංවතුර තත්වය*

අගෝස්තු මස 14 වැනිදා වවුනියාවේ ඇතිවූ තද සුලං සහ දැඩි වර්ෂාව නිසා මැනික්පාම් හි පිහිටි සහන කඳවුරු ජලයෙන් යටවී දැඩි ලෙස හානියට පත්විය. මේ අතුරින් වඩත්ම හානියට පත්වූයේ කලාප අංක 3 සහ 4 ය. කලාප අංක 4 හි සමස්ත ජනගහනය වන 36785 කින් 17539 ක් ම කුඩාරම් 37 න් 16 ක් ම හානියට පත්වීම හෝ විනාශයට පත්වීම නිසා හිසට සෙවනක් නැතිව ඉමහත් අසරණ වූහ.

තත්වය වඩාත් බැරෑරුම් කරමින් ඉවසිය නොහැකි දුගඳක් පතුරවමින් වැසිකිළි උතුරා යෑමට පටන් ගත් අතර වතුර බවුසර මඩේ එරීම නිසා ජල සැපයුම ද නැවැතිණි. ආහාර සැපයුමද අඩාල විය. රෝග පැතිරයාමේ අවදානමක් ඇතිවීමත් සමගම රජය සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය ඒ අය විසින් ඉදිකල වැසිකිළි වල ප්‍රමිතිය පිළිබඳව අවධානය යොමුකළහ.
රජය මගින් ඉදිකරන ලද වැසිකිළි වඩාත් හොඳින් භාවිතයට ගතහැකිවූ සහ දීර්ඝ කාලයක් පවතින ඒවාවූ අතර එක්සත් ජාතීන් ගේ සංවිධානය විසින් ඉදිකළ ඒවා හය මසකට පමණ කාලයක් පවතිනසේ ඉදිකළ ඒවාය. එක්සත් ජාතීන් සහ අනකුත් ආයතන මගින් ඉදිකළ වැසිකිළි කෙටි කලක් භාවිතයට සුදුසු පරිදි ඉදිකලේ අවතැන් වූවන් මෙම කඳවුරු වල ස්ථාවරව රඳවා ගැනීවී යැයි බිය පල කල බැවිනි. අනෙක් අතට රජය මෙම පිරිස් හය මසකට වඩා මෙම කඳවුරු වල රඳවා තබා ගැනීම බලාපොරොත්තු වූ හෙයින් දිගුකල් පවතින පරිදි මේවා සැලසුම් කරන ලදී.

මෙහිදී වැදගත්ම කරුණ වන්නේ පැය කිහිපයකට සීමාවූ මෙම වැස්සේ ප්‍රතිපලයක් ලෙස මෙවැනි දරුණු තත්වයක් උදාවූයේ නම් ඉදිරියේදී ඇද හැලීමට නියමිත මෝසම් වැස්සේදී කුමන තත්වයක් උදාවේද යන්නයි. මෙම සිද්ධිය පූර්ව අනතුරු හැඟවීමක් ලෙස සලකා සලකා අනාගතයේ සිදුවිය හැකි හානි අවමකර ගැනීම සඳහා ක්‍රියාත්මක වීම අත්‍යාවශ්‍ය වේ.
කණගාටුවට ලක්වන අනෙක් කරුණ වන්නේ

මේ සිද්ධිය පිළිබඳව ජාතික මාධ්‍ය ප්‍රකාශයට පත්වීම්දී දක්වට ලැබුණු ඇල්මැරුනු ස්වභාවයයි. අවතැන් කඳවුරු වල දහස් ගණනක් ජනයා පීඩවට පත්වී සිටියත් ඒ පිළිබඳව දකුණ් ජනතාව දැන සිටියේ ඉතා අල්ප වශයෙනි.

නැවත පදිංචි කිරීම
වන්නියේ සහන කඳවුරු වල සිටි විශාල සංඛ්‍යාවක් යාපනය දිස්ත්‍රිකක්යේ සහ ත්‍රිකුණාමල දිස්ත්‍රිකක්යේ යළි පදිංචි කරන ලදී. මෙම යළිපදිංචි කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා ජාතිය ගොඩනැංවීමේ අමාත්‍යාංශය බිම් බෝම්බ ඉවත්කිරීමේ ආයතන සහ යුද්ධහමුදාව ඒකාබද්ධව වැඩපිළිවෙලක් සැලසුම් කරන ලදී මෙවැනි බිම්බෝම්බ සෙවීම් සමීක්ෂණ කිහිපයක් ක්‍රියාත්මක වන අතර රජය මෙම වැඩ පිළිවල කඩිනම් කිරීමට පරිශ්‍රමයක් දරණ ඇත. මෙමගින් දින 180 ක් ඇතුලත අවතැන්වූ පුද්ගලයන් යළි පදිංචි කිරීමේ වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකිවේ යැයි අපේක්ෂා කෙරේ. මේ අතර රජයේ ජේෂ්ඨ නිලධාරීන් විසින් අවතැන්වූවන් පදිංචි කිරීමට පෙර අධ්‍යාපනයල සෞඛ්‍යයල කෘෂිකර්මය වැනි අංශ යළි ස්ථාපිත කිරීමට කටයුතු යොදමින් පවතී. ප්‍රාදේශිය ලේකම් වරුන් දැක්වූ අදහස් වලට අනුව මෙවැනි අවශ්‍යතා පවතින ප්‍රදේශ හඳුනාගන්නා ලෙස රජය ඉල්ලීමක් කර ඇත .

# දිස්ත්‍රික්ක විශ්ලේෂණ - 2009 ජූනි 27 - ජූලි 28

## අම්පාර

*ව්‍යූහයන්*
අම්පාර දිස්ත්‍රික්කයේ සිදුවූ සිවිල් ජනයා පැහැරගෙන යාම සොරකම් දූෂණ සහ ඝාතන නිසා සාමකාමි වාතාවරණය බිඳ වැටිනි. එසේ නමුත් ජනතාව මේ පිලිබඳව පොලීසියට පැමිණිලි කිරීමට පැකිලෙන්නේ මෙම සිදුවීම් විවිධ කණ්ඩායම් වලින් දේශපාලන අනුග්‍රහයන් මත සිදුවන්නේයැයි විශ්වාස කරන බැවිනි . මෙම කණ්ඩායම් නිරායුධ කිරීමට රජය විසින් දරන ලද වෑයම අසාර්ථක වීමද ජනතාවගේ මේ පිළිබඳව බලාපොරොත්තු බිඳ වැටිමට හේතුවිය.

LTTE සහ STF අතර සමහර අවස්ථා වලදී ගැටුම් ඇතිවිය. මෙය සැඟවී සිටින ත්‍රස්තවාදීන් පිළිබඳව අවධියෙන් සිටිය යුතු බවට ජනතාවට සිහිකැඳවයි. යුද්ධය අවසන් වීමත් සමගම අනෙකුත් ප්‍රශ්න කරළියට පැමිණෙමින් පවතී. මේවා අතර අවතැන්වූවන් ලදේශපාලන ස්ථාවරත්වය සමාන ලෙස සංවර්ධන ආධාර ලබාදීම සහ නව ආයෝජකයින් ගෙන්වා ගැනීම මගින් දිස්ත්‍රික්කය සංවර්ධනය කිරීමද වේ. මේ අතර මහාමාර්ග ඉදිකිරීම ජලසැපයුම සහ වාරිමාර්ග පහ-සුකම් ලබාදීම තැපැල් හා විදුලි සංදේශසෙවා වැඩි දියුණු කිරීම සිදුවෙමින් පවතී.

*ක්‍රියාකාරකයින්*
රජයල දිස්ත්‍රික්කයේ දේශපාලන බලවතුන් සහ ආරක්ෂක හමුදා ප්‍රධාන ක්‍රියාකාරකයින් වේ.

ක්‍රියාත්මක වන ආකාරය
LTTE සහ ආරක්ෂක හමුදා අතර කලාතුරකින් හෝ ඇතිවූ ගැටුම් දිස්ත්‍රික්කයේ ජනතාවට යම් ආකාරයක අනතුරු හැඟවීම් ලබාදේ. සාමය ගොඩනැංවීම ප්‍රමුඛ අවශ්‍යතාවක් බවට පත්වී ඇති අතර රජය සහ රාජ්‍ය නොවන සංවිධාන මෙම අවශ්‍යතාවය ජනතාවටග් සහයෝගය ඇතිව සපුරාලීමට කටයුතු කරමින් සිටි.

*ක්‍රමෝපායන් හා විකල්ප*
අදාළ ආයතන වල බලධාරීන් සාමය ගොඩනැංවීමේ කටයුතු පිළිබඳව අවධානය යොමුකළ යුතුවේ. එසේම ජනතාව සතු අයිතිවාසිකම් සහ යුතුකම් පිළිබඳව ඔවුන් දැනුවත් කළ යුතුවේ. මෙසේ වන්නේ අදාළ දිස්ත්‍රිනකක්යේ ජනතාව අර්ධ වශයෙන් බඔඹෑ පාලනයට යටත්වී සිටිම නිසා ප්‍රජාත්‍රන්ත්‍රවාදය යන්න ඔවුන්ට නව සංකල්පයක් වන බැවිනි.

## මඩකලපුව

ව්‍යුහයන්
ආයුධ සන්නද්ධ කණ්ඩායම් වල ක්‍රියාකාරිත්වයන් ඉහළ යමින් තිබේ. පැහැරගෙන යාම් සහ අනෙකුත් සිදුවීම් වල වැඩිවීමක් දක්නට ඇත. මෙසේ වීමට ප්‍රධාන හේතුව නම් මේවා පාලනය වීමක් නොමැතිකමය. ආයුධ සන්නද්ධ කන්ඩායම් නිරායුධ කිරීමේ රජයේ වැයම අසාර්ථකවී ඇත. මෙසේ වීමට ප්‍රධාන හේතුව නම් මෙම කණ්ඩායම් වලින් බහුතරයක් දේශපාලන අනුග්‍රහය මත මෙම වරප්‍රසාද භුක්ති විඳීමයි.

දිස්ත්‍රික්කයේ වඩාත් අවධාරණයට ලක්විය යුතු කරුනු අතර අවතැන්වූවන් නැවත පදිංචි කිරීමල දේශපාලන සහ ආරක්ෂාව පිළිබඳ ස්ථාවරභාවයල විශාල ප්‍රමාණයේ ආයෝජනයන්හි අවශ්‍යතාවය සහ සංවර්ධන කටයුතු සාධාරණ අයුරින් බෙදාහැරීමත්ය.

මෙහිදී සඳහන් කළයුතු වැදගත් කරුණක් වන්නේ යුද්ධයෙන් පසුව විශේෂයෙන් නගර ආශ්‍රිතව ආරක්ෂාවේ වර්ධනයක් දක්නට ඇතත් ගම් ප්‍රදේශ තවමත් අයුධ සන්නද්ධ කණ්ඩායම් වල බලපෑමට ලක්වී ඇති බවය. මෙම තත්වය ඇතිවී තිබෙන්නේ ආරක්ෂක හමුදා මෙම ප්‍රදේශවල ප්‍රමාණවත් අන්දමින් නොසිටින බැවිනි.

ක්‍රියාකාරීන්
දිස්ත්‍රිකක්යේ දේශපාලකයින් රාජ්‍ය නොවන සංවිධාන සහ ආයුධ සන්නද්ධ කණ්ඩායම් ප්‍රධාන ක්‍රියාකාරීන් වෙති.

ක්‍රියාත්මක වන ආකාරය
ජනතාව තමන්ගේ ගැටළු ප්‍රශ්න ප්‍රසිද්ධියේ කථා කිරීමට මැළිකමක් දක්වති. මෙසේ වීමට හේතුව ප්‍රදේශයේ පවත්නා දේශපාලන අස්ථාවරභාවයත් බලගතු දේශපාල පක්ෂ සියලුම දේ තමන්තේ අධිකාරියට නතු කරගෙන සිටින බැවින් ජනතාව ප්‍රජාත්‍රන්ත්‍රවාදී ආකාරයට තමන්ගේ ප්‍රශ්න සහ කම්කටොළු ඉදිරිපත් කිරීම පලක් නොවන බව සිතන බැවිණි. මේ අතර ගමන් කිරීම සඳහා බලපත්‍ර ලබාගැනීම අහෝසි කිරීමත් සමගම ජනතාවට නිදහසේ දිස්ත්‍රික්කය තුල සහ ඉන් පිටතට යෑමට අවස්ථාව සැලසිම ඔවුන්ගේ සතුටට හේතුවී තිබේ.

ක්‍රමෝපායන් හා විකල්ප
අවිගත් කණ්ඩායම් සහ ඔවුන් ට සහයෝගය දක්වන්නන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගතයුතු වේ. මෙසේ වන්නේ ඔවුන් දිස්ත්‍රික්කයේ සාමයට හා සංවර්ධනයට බාධාවක් වන බැවිනි. මේ සම්බන්දයෙන් ගතහැකි එක් ක්‍රියාමාර්ගයක් වන්නේ සියලුම අවිගත් කණ්ඩායම් නිරායුධ කිරීමයි. දේශපාලන සම්බන්ධකම් හෝ තරාතිරම නොබලා ඔවුන්ට එරෙහිව කටයුතු කිරීමට රජය මගින් මේ සඳහා නිසි උපදෙස් පොලීසියට සහ ආරක්ෂක හමුදා වලට ලබාදිය යුතුයි. දුරබැහැර පිහිටා ඇති ගම්වල ආරක්ෂාව තරකළ යුතුය. එසේ වන්නේ මොවුන් ඕනෑම අවස්ථාවන පහරදීමකට ලක්විය හැකි බැවිනි.

## කොළඹ

ව්‍යුහයන්
පොලීසියේ අමානුෂිය සහ පාලනයෙන් තොර ක්‍රියාකාරකම් පිළිවඳ වාර්ථා ප්‍රධාන වශයෙන් අවධානයට ලක්විය. මෙම නීතිය ක්‍රියාත්මක කරවන නිලධාරීන්ගේ පාලනයෙන් තොර හැසි-රීම මහජනතාවගේ බලවත් විරෝධයට ලක්වූ අතර මේ හේතුව නිසා අදාළ සිද්ධින් පිළිබඳව ජනාධිපතිතුමාගේ අවධානයට ලක්වීමත් ඉන් අනතුරුව උසස් පොලින් නිලධාරීන් විසින් මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීමත් සිදුවිය. මෙයින් එක් සිදුවීමකදී කොළඹ අපරාධ කොට්ඨාශයේ යැයි පැවසෙන නිලධාරීන් විසින් මාලඹේ තොරතුරු තාක්ෂණ පීඨයේ සිසුවකු පැහැරගෙන ගොස් පහර දීමකට ලක්කරන ලදී. මෙය උසස් පොලිස් නිලධාරියකු ගේ පුත්‍රයෙකුගේ අවශ්‍යතාවය මත සිදුවී ඇත. අනෙක් අවස්ථාවේදී හිරිහැර කිරීම පිළිබඳ පැමිණිල්ලක් මත පොලිසිය විසින් අත්අඩංගුවට ගන්නා ලද තරුණයින් දෙදෙනෙකු දැඩි ලෙස පහරදීමට ලක්කර පසුව වෙඩිතබා ඝාතනය කරන ලදී.

පාතාලයට එරෙහිව රජය මගින් ප්‍රකාශ කරන ලද යුද්ධය වේගවත් කර තිබෙන බව පෙනීගියේය. පාතාලයේ බලවත් පුද්ගලයින් කිහිපදෙනෙක්ම කොළඹ අවට ප්‍රදේශ වලදී ඔවුන්ට විරුද්ධ කණ්ඩායම් මගින් මරුමුවට පත්විය.

දිගින් දිගටම කෙරෙන පිරික්සුම් මෙහෙයුම් මගින් අවි ආයුධ විශාල ප්‍රමාණයක් සොයාගැනීමට ආරක්ෂක අංශ සමත්වී තිබේ. එසේම බඔඹෑ සංවිධානය සමග සම්බන්ධ යැයි සැකකෙරෙන පුද්ගලයින් විශාල සංඛ්‍යාවක්දලගම්පහ ප්‍රදේශයේ ජේෂ්ඨ පොලිස් නිලධාරියකුද ඇතුළුව අත්අඩංගුවට ගන්නා ලදී.

ඩෙංගු වසංගත තත්වය එන්න එන්නම උත්සන්න වෙමින් පවතී. ශ්‍රී ලංකා ඉතිහාසයේ

සිදුවූ වැඩිම ඩෙංගු මරණ සංඛ්‍යාව මෙම වසරේ මුල් මාස 8 තුලදී වාර්ථා විය. මෙහිදී කොළඹ දිස්ත්‍රික්කය වඩාත්ම බලපෑමට ලක්වූ දිස්ත්‍රික්කයක් විය.

ක්‍රියාකාරකයින්
පොලිසීය හා අනෙකුත් ආරක්ෂක අංශ රජය සහ සෞඛ්‍ය අංශයේ නිලධාරීන් මෙම කාලසීමාමේ ප්‍රධාන ක්‍රියාකාරකයින් ලෙස දැක්විය හැකිය

ක්‍රියාත්මක වන ආකාරය
පොලිස් අත්අංඩගුවේ පසුවූ පුද්ගලයින් විශාල සංඛ්‍යාවක් මියයාමත් අනවශ්‍ය ලෙස පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමත් සහ පහර දීමට ලක්කිරීම නිසාත් පොලීසිය සහ ජනතාව අතර සම්බන්ධතාවය විශාල වශයෙන් බිඳ වැටිමට ලක්විය.
මේ අතර සෞඛ්‍ය බලාධාරීන් සීඝ්‍රයෙන් පැතිරයන ඩෙංගු රෝගය සහ එමගින් සිදුවන මරණ සංඛ්‍යාව අඩුකර ගැනීමට නිරන්තර සටනක යෙදී සිටිති.

ක්‍රමෝපායන් හා විකල්ප
පොලීසිය හා හමුදාවල ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දේශපාලනමය හෝ අනෙකුත් ආකාරයේ ඉහළ මට්ටමේ ඇඟිලි ගැසීම් සිදුනොවන බවට රජය වගබලා යුතුවේ. එසේම තමන්ගේ වාසි ප්‍රයෝජන තකා වගකීමෙන් තොරව හැසිරෙන නිලධාරීන්ට එරෙහිව තදින් ක්‍රියා කිරීමද අවශ්‍යවේ. ජනතාවට සංජානනය වන්නේ පොලීසිය වගකීම් රහිතව හිතුමතේ හැසිරෙන බවත් මෙසේ වන්නේ ඉහළ මට්ටමේ රජයේ නිලධාරීන් ගේ අනුග්‍රහය මත බවත්ය. එසේම මෙවැනි ක්‍රියාවන්ට මහජන විරෝධය දැක්වීමේ යාන්ත්‍රණයන්ද සැකසෙමින් පවතී. නීතිය ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් බලපෑම් සිදු නොවීමට රජය ක්‍රියාමාර්ග ලත යුතුය. අපරාධ වලට සම්බන්ධ පුද්ගලයින් ඉවත්කිරීම සම්බන්ධයෙන් මහජන ප්‍රසාදනය පලවෙමින් පවතී. එසේ නමුත් මොවුන් සම්බන්ධයෙන් වුවත් ණීවෙඩි හුවමාරුවලදී මරණයට පත්විම් වලට ලක්වීමෙන් තොරව නිසි අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාවලියක් සහ දඩුවම් ලබාදීමේ ක්‍රමවේදයක් සැලසීම අවශ්‍යය.

## යාපනය

ව්‍යුහයන්
තවමත් ඉතිරිවී ඇතැයි සැක කෙරෙන ත්‍රස්තවාදීන්ගෙන් බලපෑම් එල්ලවෙතැයි සැකයෙන් දිස්ත්‍රික්කය අවධානයෙන් සිටි. ඝාතන වලට සහ ආරක්ෂාව හා සම්බන්ධ කරුණුවලට සෘජුවම සම්බන්ධව යැයි සැකපිට ක්‍රියාකාරී බඹඹෑ සාමාජිකයින් 4 දෙනෙක් මෙම වාර්ථා කරන මසක කාලසීමාවේදී අත්අඩංගුවට ගන්නා ලදී. කෙසේ වෙතත් යුද්ධයේ අවසන් මාස කිහිපය තුල පැවැති ආතතිකාරී තත්වයන් ක්‍රමයෙන් පහව යමින් ජනතාව ඔවුන්ගේ එදිනෙදා කටයුතු වලට යොමුවෙමින් සිටිති.

එක්සත් ජනතා සංධානය ආසන 13 ක් දිනාගනිමින් යාපනය නගර සභාව ජයගත් අතර දෙමළ ජාතික සංධානය ආසන 8 ක් හිමිකර ගනිමින් ප්‍රධාන විපක්ෂය බවට පත්විය. මෙහිදී සඳහන් කළයුතු කරුණක් වන්නේ මෙය දිස්ත්‍රික්කයේ වසර 11 කට පසුව පැවැති මේ ආකාරයේ මැතිවරණය බවත් එහිදී ජන්දදායකයන්ගෙන් 18 ක් පමණක් ඡන්දය ප්‍රකාශ කළ බවත්ය.
රජය තම උතුරු වසන්තය වැඩසටහන මගින් මහාමාර්ග ආදී යටිතල පහසුකම් ගොඩනැංවීමටත් එමගින් ආයෝජනයන් මේ ප්‍රදේශවලට ගෙන්වා ගැනීමටත් බලාපොරොත්තුවේ මේ අතර 2000 කට ආසන්න පවුල් සංඛ්‍යාවක් යළි තම වාසස්ථාන කරායෑමේ බලාපොරොත්තුවෙන් උතුරේ සහන කඳවුරු වල වාසය කරති.

ක්‍රියාකාරීන්
රජයල LTTE ආරක්ෂක හමුදා සහ දේශපාලකයින් ප්‍රධාන ක්‍රියාකාරීන් අතර වෙති

ක්‍රියාත්මක වන ආකාරය
රජය ප්‍රදේශයේ ජනතාවගේ ආදායම් තත්වය නංවාලීමේ වැඩසටහන් පිළිබඳව උනන්දුවක් දක්වයි. රජය සහ රාජ්‍ය නොවන අංශ මගින් මේ සඳහා තාක්ෂණික සහ මූල්‍යමය සහයෝගය සපයන අතර මෙය දීර්ඝ කාලයක් තිස්සේ සිදුකළයුතුය බව කිවයුතුය.

විවෘත කෙරුන A9 මාර්ගය ඔස්සේ උතුර සහ දකුණ අතර වෙළදාමට මඟ පෑදුනත් බොහොමයක් යාපනයේ වෙළෙඳුන් මේ සම්බන්ධයෙන් පනවා ඇති සීමාවන් සම්බන්ධයෙන් අසතුටට පත්ව සිටිති. එසේ වන්නේ මාළු සහ අලුත් එළවලු වැනිදෑ මෙම ප්‍රමාදයන් නිසා විනාශයට පත්වන බැවිනි. එසේම සමහර වෙළඳුන් දඹුල්ල වෙළඳපොලේ තම අධිකාරියත් ගොඩනගා ගෙන සිටින බැවින් ඔවුන්ට තරඟකාරී ලෙස එම වෙළඳපොළට අවතීර්ණ වීමට බාධා ඇතිවී යැයි ද ඔවුන් චෝදනා කරති. රජය මගින් දුම්රිය මාර්ගය සහ අනෙකුත් පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳව ජනතාව සතුටට පත්වී සිටින අතර මෙය 2010 වසරේදී නිමවීමට සැලසුම් කර ඇත.
ක්‍රමෝපායන් හා විකල්ප
යාපනය මහනගර සභාව සඳහා පැවැත්වූ මැතිවරණයෙන් අනතුරුව රජය ජනතාවට තම අයිතිවාසිකම් සහ යුතුකම් පිළිබඳව අවබෝධයක් ලබාදීමට කටයුතු කළ යුතුය. මෙය අවශ්‍ය වන්නේ යහපාලනය ඇතිකිරීම සහ රජයේ ආයතන සහ ජනතාව අතර මනා සම්බන්ධතාවක් ගොඩ නැගීම සඳහාය.

ආදායම් ඉපයීමේ මාර්ග නංවාලීම පිළිබඳව වැඩි අවධානයක් යොමුකළ යුතුවේ. මෙහිදී වෘත්තීය පුහුණුව වැනි අංශ පිහිටුවීම කළයුතුය. මෙමගින් ඉදිරියේ නව ආයෝජන තුලින් සැලසෙන රැකියා ඉඩප්‍රස්ථාවන් සඳහා ජනතාව පෙර සූදානම් කළ හැකිය.

එසේම A9 මාර්ගයේ භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධයෙන් වෙළඳුන් නගන චෝදනා සම්බන්ධයෙන් බලධාරීන්ගේ අවධානය යොමුකිරීමටත් ඒවා විසඳාලීමටත් කටයුතු කළ යුතුය.

## මන්නාරම

ව්‍යුහයන්
සුප්‍රසිද්ධ මඩු උත්සවය 200000 පමණ ජනතාවගේ සහභාගිත්වයෙන් මෙවර මඩු උත්සවය පැවැතිනි. 4000 කින් පමණ යුත් ආරක්ෂක අංශයේ පිරිසක් මේ අවස්ථාවේ සේවයේ යොදවා සිටියහ.

මඩු ප්‍රදේශයේ ජල සැපයුම ප්‍රමාණවත් නොවූ අතර මඩු පල්ලියට කිලෝමීටර් 10 පමණ ආසන්නයෙන් සොයා ගැණුනු නව දිය උල්පත හි ජලය බිමට සුදුසු වූයේ නම් එය ජල සැපයුම වැඩි කිරීමට යොදවාගත හැකිව තිබිණි.

මුහුදු යෑමට තිබුනු සීමාවන් ඉවත් කිරීම නිසා ධීවරයන් විශාල වශයෙන් තමන්ගේ සුපුරුදු රැකියාවට අවතීර්ණ වෙමින් සිටිති. මේ සමගම ඉන්දියානු ධීවරයන් ලංකා මුහුදු සීමාවට පැමිණ නීතිවිරෝධිව මසුන් ඇල්ලීමද වැඩි වෙමින් පවතී. මෙම ධීවරයන් සහ ශ්‍රී ලංකා නාවික හමුදාව අතර ගැටීම් ද වැඩි වෙමින් පවතී. මූසාලේ ප්‍රදේශයේ නැවත පදිංචි කිරීම ඇරඹීමත් සමග ප්‍රදේශයේ ජීවන තත්වයද එසේම වර්ධනය වෙමින් පවතී.

ක්‍රියාකාරකයින්
ආරක්ෂක අංශයේ නිලධාරීන්ල රාජ්‍ය නොවන සංවිධානල මෙම කාලසීමාවේදී ප්‍රධාන ක්‍රියාකාරකයින් වශයෙන් හඳුන්වා දිය හැක.

ක්‍රියාත්මකවන ආකාරය
මඩු උත්සවය සාර්ථක ලෙස අවසන් කිරීමට හැකිවීම මන්නාරම දිස්ත්‍රික්කයේ කතෝලික ජනතාවට පමණක් නොව මුලු දිවයිනේම කතෝලික බැතිමතුන් ගේ ප්‍රසාදයට ලක්විණි. මුහුදු යාමේ සීමාවන් ඉවත් කර තිබුණත් මෙම ධීවරයන්ට අදාළ පහසුකම් නොමැති බැවින් එම කර්මාන්තයේ යෙදීමේ අපහසුතාවයකට ලක්වී ඇත. මෙම නිසා ඔවුන් අසතුටටත් බලාපොරොත්තු සුන්වූ තත්වයටත් පත්වී සිටිති. එසේම ඉන්දියානු ධීවරයින් ශ්‍රී ලංකා මුහුදු සීමාවට ඇතුලු වීමත් සමග ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව සමග ගැටලු ඇති කර ගැනීමත් හේතුවී ඇති බැවින් ධීවරයන්ට බාධාකාරී තත්වයක් ඇතිවී තිබේ.

ක්‍රමෝපායන් හා විකල්ප
රජය මෙම මහ කන්නයට පෙර යළි පදිංචි කිරීම පිළිබඳව අවධානය යොමුකළ යුතුය. මෙමගින් ඔවුන්ගේ වගාකටයුතු නියමිත කලට ඇරඹීමටත් එමගින් ආදායම් උපයා ගැනීමටත් හැකිවනු ඇත.
මහජන ප්‍රවාහන සේවා සම්බන්ධයෙන් පනවා ඇති සීමාවන් ඉවත් කිරීමට කටයුතු කිරීම මගින් අපහසු කාරී ලෙස වෙනත් බස් රථ වලට මාරුවීමේ අවශ්‍යතාවය ඉවත් වනු ඇත. මෙම වර්ෂාව පවතින කාලසීමාවේ මහත් හිරිහැරයක් බවට පත්වී තිබේ.

එසේම අවතැන් වූවන් අතර සිටින මාස ගණනාවක් තිස්සේ අධ්‍යාපනය ලැබිමට අවස්ථාව නොලැබුණු විශ්වවිද්‍යාල සිසුන්ට නැවත අධ්‍යාපනය ලැබිමට අවස්ථා සලසා දීම කෙරෙහි බලධාරීන්ගේ අවධානය යොමුවිය යුතුය.

## ත්‍රිකුණාමලය

### ව්‍යුහයන්

යුද්ධය අවසන්වීමත් සමගම නැගෙනහිර ප්‍රදේශයේ බහුතරයක් සිසුන් තමන්ගේ අධ්‍යාපන කටයුතු නැවත ඇරඹීමට මහත් උනන්දුවක් දක්වති. නැගෙනහිර පළාතේ අධ්‍යාපන බලධාරීන් විද්‍යාව සහ ගණිතය වැනි විෂයයන් සම්බන්ධයෙන් පවතින ගුරු හිගය මගහැරවීම සඳහා විශ්‍රාම ගිය ගුරුවරුන්ගේ සේවය බලා ගැනීමට සැරසේ .

නැවත පදිංචි කිරීම දිගටම සිදුවෙමින් පවතී නැවත පදිංචි කිරීම සඳහා නියමිත පවුල් වල තොරතුරු පොලිස් විමර්ශන සඳහා යොමුකර ඇත. මෙම කටයුතු අවසන්වූ වහාම ඔවුන් ඔවුන්ගේ මුල්ගම් වල නැවත පදිංචි කරනු ඇත.

දේශිය සහ අන්තර්ජාතික ආයෝජකයින් රැසක් ත්‍රිකුණාමලයේ තම ආයෝජන අවස්ථා පිළිබඳව කරුණු විමසති. මෙම දිස්ත්‍රික්කයේ ලෝකයේ හොඳම ස්වාභාවික වරායක් සේ ගැනෙන ත්‍රිකුණාමල වරාය පිහිටා තිබෙන නිසා නාවික සේවා සඳහා වූ ආයෝජකයින් මේ පිළිබඳව දැඩි උනන්දුවක් දක්වති.

බැංකුල තොරතුරු තාක්ෂණ ආයතනල ක්ෂණික ආහාර අලෙවි කරන ආයතන යනාදිය දැනටමත් තම ව්‍යාපාර අරඹා ඇත. මෙය අනාගතයේ ත්‍රිකුණාමලයේ අනාගතයේ සංවර්ධනය පිළිබඳ ඉගියක් ලබාදේ. විදේශ රැකියා ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල මහතාත් ජාතිය ගොඩනැංවීමේ ඇමතිතුමාත් දිස්ත්‍රික්කයේ නිරීක්ෂණ චාරිකාවක නිරත වූහ. මෙහිදී ඔවුන් විදේශ රැකියවල නියුක්ත වීමට කැමැත්තෙන් සිටින අය ලියාපදිංචි කිරීමේ ජාතික වැඩ පිළිවෙළට මෙම දිස්ත්‍රික්කනයද ඇතුලත් කිරීම පිළිබඳව විමසා බැලුහ.
මේ අතර උසස් පෙළ විභාග මධ්‍යස්ථාන කලාප සහ විදුහල් මට්ටමින් පිහිටුවන ලද අතර අවතැන්වූ ලමුන් ද ඇතුලුව සිසුන් විශාල පිරිසක් මෙයට පෙනී සිටියහ

### ක්‍රියාකාරකයින්

අධ්‍යාපන බලධාරීන්ල දේශිය සහ විදේශිය ආයොජකයින් සහ අවතැන් වූවන් ප්‍රධාන ක්‍රියාකාරකයින් ලෙස සැලකිය හැකිය

### ක්‍රියාත්මකවන ආකාරය

දිස්ත්‍රික්කයට පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාව ඉතා ඉක්මනින් වර්ධනය වීමත් සමගම රැකියා අවස්ථාවන් වැඩිවීමත් ආදායම් තත්වය වැඩිකිරීමේ අවස්ථා එලැඹීමත් නිසා සංචාරක හෝටල් තමන්ගේ සේවක සංඛ්‍යාව ඉහළ නංවමින් වැඩිවන ඉල්ලුමට මුහුණ දීමට සූදානමෙන් සිටි.

කෙසේ වෙතත් සංචාරක හෝටල් වල තත්වය සහ විදුලිය මහා මාර්ග වැනි අනෙකුත් යටිතල පහසුකම් වල තත්වය වැඩිදියුණු කිරීම අත්‍යාවශ්‍ය වේ. මෙසේ වන්නේ පවත්නා පහසුකම් පැමිණෙණ විදේශිය සංචාරකයන්ගේ මූලික අවශ්‍යතාවන් සැපිරීමට ප්‍රමාණවත් නොවන හෙයිනි.

අවතැන්වූවන් යළි පදිංචි කිරීමත් සමගම ආරක්ෂක අංශ බඹඹෑ සාමාජිකයන් අවතැන්වූවන් අතර සැගවීමට ගන්නා උත්සාහයන් නතර කිරීමට කටයුතු කරමින් සිටි.

### ක්‍රමෝපායන් හා විකල්ප

වෘත්තීය පුහුණු ආයතන පිහිටුවා අදාළ දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන්ට එම ප්‍රදේශයන්ට අවශ්‍ය වෘත්තීය පුහුණුව පාඨමාලා එනම් ඉදිකිරීම්ල තොරතුරු තාක්ෂණය සහ සංචාරක කර්මාන්තය වැනි අංශ වල පුහුණුව ලබාදිය යුතුය. එසේම භාෂා හැකියාව ලබාදීමද අත්‍යවශ්‍ය වේ. මෙය අවශ්‍ය වන්නේ දිවයිනේ අනෙකුත් ප්‍රදේශ වල තරුණ තරුණියන්ට සමග ශක්තිමත්ව තරඟ කිරීමේ හැකියාව මෙම දිස්ත්‍රික්කයේ තරුණ තරණියන්ටද ලබාදීමටයි. මෙම අවස්ථාව පසුගිය වසර වල මග හැරී තිබිණි. ඒවාගේම අවතැන්වූ ජනතාව සඳහා ආදායම් ඉපැයීමේ මාර්ග ජනිත කිරීම පිළිබඳව ප්‍රමුඛතාව හිමිවිය යුතුය.

## වව්නියාව

### ව්‍යුහයන්

අපරාධ අවම සංඛ්‍යාවක් වාර්තාවීම හේතුකොට ගෙන දිස්ත්‍රික්කයේ සාමාන්‍යයෙන් සාමකාමී වාතාවරණයක් පැවැතිනි. කෙසේ වෙතත් අවතැන් වූවන්ගේ තත්වය ඇද වැටෙන වර්ෂාව සමග වඩාත් අයහපත් විය. පවුල් 80000 කට අයත් 250000 ක අවතැන් වූවන් පිරිසක් වවුනියාවේ කඳවුරු 20 ක වාසය කරති. මෙම මස මුලදී පවුල් සුලු සංඛ්‍යාවක් මෙම කඳවුරු වලින් මුදා හරින ලදී. වවුනියාව දිසාපති පැවසූයේ ගම්මාන 16 ක බිම්බෝම්බ ඉවත්කර ඇති බවය. මෙම ගම්මාන වලට මාර්ග ජලය සහ විදුලිය යන පහසුකම් සැපයීමෙන් අනතුරුව තවත් අවතැන්වූවන් පදිංචි කරන බවද පැවැසීය.

මෑතකදී ඇතිවූ ගංවතුර තත්වය හේතුකොට ගෙන කඳවුරු වල තත්වය වඩාත් නරක අතට හැරනු අතර පවුල් 1000 කට වැඩි සංඛ්‍යාවක් මෙම නිසා වෙනත් ස්ථාන වලට ගෙන යාමට සිදුවිය. කඳවුරු බිම දැඩිසේ මඩවූ අතර මෙහි ඇවිද යෑමට පවා නොහැකි වූ අතර වාහන මඩේ එරී ගියේය. මළ අපද්‍රව්‍ය ඉවත් කරන වාහන සහ ජලය බෙදා හරින වාහන වලට කඳවුරු කරා යෑමට නොහැකි විය. වතුරෙන් යටවීම නිසා දර භාවිතා කර ආහාර පිසීමට නොහැකිවීම හේතු කොටගෙන පිසූ ආහාර සැපයීමට සිදුවිය. එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් තුනීලැලි භාවිතා කර සකසන ලද වැසිකිළි භාවිතාවට ගත නොහැකි තත්වයට පත්විම නිසා වැසිකිළි ප්‍රශ්නය තවතවත් උග්‍ර විය. වැසිකිළි උතුරා ගිය අතර මළ අපද්‍රව්‍ය සහ කුණු කසල කඳවුරු තුලට ගලා එන්නට විය.

ඇම්නෙස්ටි ජාත්‍යන්තර අංවිධානය මගින් මෙම අවතැන්වූවන් මුදා හරින ලෙස නැවත වතාවක් ඉල්ලා සිටි අතර ශ්‍රීෂෘ ආයතනය ඉක්මනින් නැවත පදිංචි කරවන අය සඳහා 6 මසක් යනතුරු ආහාර ලබාදීමට ලෝක ආහාර සංවිධානය වෙත රුපියල් මිලියන 1ග7 ක ආධාර ලබා දීමට පෙරොන්දු විය. නැවත පදිංචි කිරීම ඉක්මන් කිරීම සඳහා අවතැන්වූවන්ට හඳුනා ගැනීමේ ලියකියවිලි සැකසීමේ ජංගම කාර්යාල ආරම්භ කර ඇත.

මේ අතර A/L විභාගය සඳහා පෙනී සිටි අවතැන් වූ සිසුන් 1887 ගෙන් 166 දෙනෙක් ලමා සොල්දාදුවන් ලෙස කටයුතු කළ අයබව හෙළිවිය. අවතැන් කඳවුරු වල පවත්නා අයහපත් සනීපාරක්ෂක තත්වය නිසා මෙනන්ජයිටිස් සහ එන්සෙපලයිටිස් වැනි රෝග නිසා 34 දෙනෙක් මෙම තෙමසක කාලසීමාව තුල මරණයට පත්විය. එසේම ලේ හිගකමින් පෙලෙන ගැබිණි මව්වරුන් විශාල සංඛ්‍යාවක් පිළිබඳවද වාර්ථාවූ අතර ඔවුන් ගැන අවධානය යොමු කළ යුතුය.

### ක්‍රියාකාරීන්

රජයේ නිලධාරීන් සහ ආයතන සෞඛ්‍ය අංශ රාජ්‍ය නොවන සංවිධාන සහ අවතැන් වූවන් ප්‍රධාන ක්‍රියාකාරකයින් ලෙස සැලකිය හැකිය

### ක්‍රියාත්මකවන ආකාරය

අවතැන් වූවන් නැවත පදිංචි කිරීම නිසා දිස්ත්‍රික්කයේ දෙමළ ජනතාව ධෛර්‍යයට පත්වී සිටිති. අවතැන් කඳවුරුවල තත්වයන් පිළිබධව වහාම අවධානයට ලත්විය යුතුය. මෙම කඳවුරු වාසය කිරීමට නොහැකි තත්වයකට පත්වී ඇති අතර පවත්නා තත්වයන් තුල ලෙඩරෝග පැතිරයෑමේ අවධානමක් ඇත.

උප්පැන්නල විවාහ වැනි සහතික පිළියෙළ කිරීමට පිහිටුවා ඇති ලිපිලේඛණ පිළියෙළ කිරීමේ ජංගම කඳවුරු ජනතාවගේ මහත් ප්‍රසාදයට හේතු වි තිබේ.

### ක්‍රමෝපායන් හා විකල්ප

සෞඛ්‍ය සේවා වල නියැලෙන රජයේ ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන මෙනින්ජයිටිස් සහ එන්සෙපලයිටිස් වැනි රෝග පැතිරයාම පිළිබඳව ඉක්මන් අවධානය යොමුකළ යුතුයි. මෙමගින් ඇතිවිය හැකි මරණ සංඛාව අවමකරගත හැකිය. ප්‍රතිශක්තීකරණ සායන පැවැත්විය යුතු අතර දිස්ත්‍රික්කයේ රෝහල් වලට රෝග හඳුනා ගැනීමට හා ප්‍රතිකාර කිරීමට අවශ්‍ය නියමිත පහසුකම් ඉක්මනින් සැලසිය යුතුය.

යළිපදිංචි කිරීමේ ක්‍රියාවලිය වේගවත් කළ යුතුය. මෙම මාස 3 ඇතුළත නැවත පදිංචි කර ඇත්තේ **4%** ප්‍රමාණයක් පමණි. අවතැන් වූවන් ගේ නෑදෑහිතවතුන් සමග තාවකාලිකව පදිංචියට යැවීමත් ආගමික ආයතයන වලට වැඩිහිටියන් සහ ආබාධිතයන් යොමුකිරීමට පියවර ගැනීමත් අවතැන් කඳවුරු වල ඇති තදබදය අවමකිරීමට මෙහිදී රජයට සලකා බැලිය හැකි අනෙකුත් ක්‍රියාමාර්ග වේ. මෙම ක්‍රියාමාර්ගය අවතැන් කඳවුරු වල වෙසෙන ජනතාවගේ නිවාසල ආහාර යනාදී පහසුකම් වල තත්වය වැඩි දියුණු කිරීමටද හේතුවේ.

අප ගේ වෙබ් අඩවියට පිවිසෙන්න

http://www.humanitarian-srilanka.org/Knowledge_Centre/ Publications.php

මානුෂීය සේවායතන සමූහය විසින් ඉදිරිපත් කරනු ලබන **ක්ෂණික තතු විමසුම** මගින් මානුෂීය සේවා සහ සංවර්ධන කටයුතුවල නියැලෙන ආයතන සිය සැලසුම් සකස් කිරීමේ දී එක් එක් ප්‍රදේශයේ පවතින තත්ත්වය අවබෝධ කර ගැනීමෙන් එම ප්‍රදේශයේ අවශ්‍යතාවන්ට අනුකූලව මානුෂීය සහ සංවර්ධන කාර්යයන් සැලසුම් කර ගැනීමට ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීමට අපේක්ෂා කරයි.

එමෙන්ම මෙම **ක්ෂණික තතු විමසුම** මගින් අදාල දිස්ත්‍රික්කයන්හි පවතින සාමයට ගොඩනැගීමට හෝ ගැටුම්වලට තුඩුදෙන සංවේදී තොරතුරු නිරාවරණය කරන හෙයින් ආයතනයන්ට එම ප්‍රදේශවල ගැටුම් ඇති නොවන ආකාරයට සහ ගැටුම් අවම කිරිම/සාමකාමී බවට පරාවර්තනය කිරීමට හා සාමය ගොඩනැංවීමට උපරිම අයුරින් දායක විය ආකාරයෙන් කටයුතු කළ හැකිය.

අවදානම් තත්ත්වය තක්සේරු කිරීම මගින් ආයතනයන්ට තම මෙහෙයුම් කටයුතුවල නියැලෙන අතර සිය සේවකයන් ගේ සහ එම ආයතන කටයුතු කරන ප්‍රදේශයේ ජනතාව ගේ ආරක්ෂාව ද තහවුරු කිරීමට හැකියාව ලැබේ.

බාහිර පාර්ශවයන් සලකා බැලීමේ දී (පොදු ජනතාවල ජාත්‍යන්තර ප්‍රජාව) සංදර්භ විශ්ලේෂණය මගින් උද්දේශන සඳහා අවශ්‍යය වන ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කයන්හි පවතින තත්ත්වය පිළිබඳව ප්‍රමාණවත් මෙන්ම සමබර තොරතුරු ලබාදෙයි.

මෙම වාර්තාව පිළිබඳව ඔබගේ අදහස් සහ යෝජනා දැනගැනීමට අපි කැමැත්තෙමු. අපගේ ඊ-මේල් ලිපිනය feedback@cha.lk

මානුෂීය සේවායතන සමූහය,
30/81, ලොන්ඩන් පෙදෙස, කොළඹ 7
දුර/ෆැක්ස්: 94-112506855/2598413